LAW & SOCIETY TRUST
නීතිය හා සමාජ භාරය

# දිට්වා සුළි කුණාටුවෙන් පසු රජය විසින් ගනු ලැබූ නෛතික සහ පරිපාලන ක්‍රියාමාර්ග

LST Monthly Law Tracker - Special Edition

LAW TRACKER

## දිත්වා සුළි කුණාටුවෙන් පසු රජය විසින් ගනු ලැබූ නෛතික සහ පරිපාලන ක්‍රියාමාර්ග

**2025 නොවැම්බර් 28** වෙනි දින ශ්‍රී ලංකාවට ඇතුල් වූ දිත්වා සුළි කුණාටුව, මෙරට පෙර නොවූ විරූ තරම් අධික වර්ෂාපතනයක්, පුළුල්ව පැතිරුණු ගංවතුර සහ මාරාන්තික නායයෑම් ඇති කරමින් රටේ යටිතල පහසුකම් ව්‍යුහය සහ ආපදා ප්‍රතිචාර ධාරිතාවය ක්‍රමානුකූලව බිඳ දැමුවේ ය. මෙම නිවර්තන සුළි කුණාටුව රට හරහා ගමන් කිරීම හේතුවෙන් රටේ පරිපාලන දිස්ත්‍රික්ක 25 පුරා ම දැඩි ගංවතුර තත්ත්වයක් ඇති වී, මධ්‍යම කඳුකරයේ බෑවුම් අස්ථාවර වී නාය යෑමට ලක්වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස තහවුරු වූ පුද්ගල මරණ සහ අතුරුදහන් වීම් සිය ගණනක් සිදුවී, නිවාස, ජීවනෝපායන් සහ ජලය, විදුලිය, ප්‍රවාහනය සහ සෞඛ්‍ය සේවා වැනි අත්‍යවශ්‍ය සේවාවන් විනාශවී යාමෙන් මිලියන සංඛ්‍යාත ජනතාවක් පීඩාවට පත් විය.[1] අවතැන් වීමේ සහ විනාශයේ පුළුල් බව සැලකිල්ලට ගැනීමේ දී, මෙය ශ්‍රී ලංකාවේ මෑත ඉතිහාසයේ සිදු වූ දරුණුතම ස්වාභාවික විපත් වලින් එකක් ලෙස විස්තර කළ හැකි අතර,[2] එයින් මිලියන සංඛ්‍යාත ජනතාවක් පීඩාවට පත් වී, ඇමරිකානු ඩොලර් බිලියන ගණනක් වූ විශාල ආර්ථික පාඩුවක් සිදුවී ඇත.[3]

මෙම ආපදාවට ප්‍රතිචාර දක්වමින් ශ්‍රී ලංකා රජය ආපදා සහන සැපයීම, නැවත යථා තත්ත්වයට පත්කිරීම, අත්‍යවශ්‍ය සේවා නඩත්තු කිරීම සහ මහජන සාමය පවත්වා ගැනීම සඳහා පහසුකම් සැලසීම පිණිස පවතින නීති යටතේ නෛතික සහ පරිපාලන ක්‍රියාමාර්ග ගණනාවක් ක්‍රියාත්මක කළේ ය.

### 1. පවතින ව්‍යවස්ථාපිත ආපදා කළමනාකරණ රාමුව සහ දිට්වා ආපදාවෙන් පසු හදිසි අවස්ථා ප්‍රතිචාර ව්‍යුහය

| අංශය | දිට්වා සුළි කුණාටුවට පෙර | දිට්වා සුළි කුණාටුවට පසු |
|---|---|---|
| ප්‍රාථමික නීති සම්පාදනය | **2005 අංක 13 දරන ව්‍යසන කළමනාකරණ පනත**[4]: සැලසුම් කිරීම, සම්බන්ධීකරණය, ප්‍රතිචාර දැක්වීම සහ යථා තත්ත්වයට පත්කිරීම සඳහා රාමුවක් සපයා දෙන, සමස්ත රටට ම බලපැවැත්වෙන ආපදා කළමනාකරණ නීතිය | **මහජන ආරක්ෂක ආඥා පනත**[5] (40 **වෙනි අධිකාරය වූ), II වෙනි කොටස**: II කොටස ක්‍රියාත්මක කරන විට හදිසි අවස්ථා නියෝග පැනවීමට ජනාධිපතිවරයාට බලය ලබා දෙයි (වගන්ති අංක 2, 5-11).<br>**2025 අංක 1 දරන හදිසි අවස්ථා (විවිධ විධිවිධාන සහ බලතල) නියෝග**[6]: මහජන ආරක්ෂක ආඥා පනතේ 5 වෙනි වගන්තිය යටතේ අංක 2464/31 (2025 නොවැම්බර් 28) දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් නිකුත් කරන ලදී[7]. |
| විෂය පථය සහ අරමුණ | පනතෙහි අර්ථ දක්වා ඇති සියලු ම ආපදා සහ උපද්‍රව ආවරණය කරයි; **පෙරසූදානම, හානි අවම කිරීම, ප්‍රතිචාර දැක්වීම, සහන සැපයීම, පුනරුත්ථාපනය කිරීම සහ** | මහජන ආරක්ෂක ආඥා පනතේ 2 වෙනි වගන්තිය යටතේ ප්‍රකාශයට පත් කරන ලද හදිසි අවස්ථාවකදී මෙම නියෝග අදාළ වන අතර, එමගින් **මහජන ආරක්ෂාව, මහජන සාමය ආරක්ෂා කිරීම** |

[1] https://srilankabrief.org/sri-lanka-brief-update-cyclone-ditwah-key-facts-and-lessons-learned/
[2] https://news.un.org/en/story/2025/11/1166474
[3] https://www.worldbank.org/en/news/press-release/2025/12/22/damage-from-cyclone-ditwah-in-sri-lanka-estimated-at-4-1-billion
[4] https://www.dmc.gov.lk/images/DM_Act_English.pdf
[5] https://www.lawnet.gov.lk/wp-content/uploads/leg_enact_1981/1981Y3V51C.html
[6] https://documents.gov.lk/view/extra-gazettes/2025/11/2464-31_E.pdf
[7] https://documents.gov.lk/view/extra-gazettes/2025/11/2464-31_E.pdf

| | | |
|---|---|---|
| | **ප්‍රතිසංස්කරණය කිරීම යන සියල්ලෙහි සම්බන්ධීකරණය මෙහෙයවනු ලැබේ** (වගන්ති 4-10 දක්වා). | **සහ අත්‍යවශ්‍ය සේවා පවත්වාගෙන යාම** සඳහා අවශ්‍ය යැයි සැලකෙන සුවිශේෂී බලතල ලබා දෙයි. |
| ප්‍රකාශයට පත්කිරීමේ යාන්ත්‍රණය | **ආපදා තත්ත්වය**: ආපදාවෙහි බරපතලකම සාමාන්‍ය ධාරිතාවය ඉක්මවා ගිය විට ජනාධිපතිවරයා විසින් ආපදා තත්ත්වයක් ප්‍රකාශයට පත්කරනු ලැබිය හැකි ය (11(1) වෙනි වගන්තිය). එම ප්‍රකාශන පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර අනුමත කර ගත යුතු අතර, යෝජනා සම්මතයක් මගින් දීර්ඝ කරනු නොලැබුව හොත් මාස දෙකකට පසු අහෝසි වේ (වගන්ති 11(2)-(4)). | **මහජන හදිසි අවස්ථාව:** ජනාධිපතිවරයා විසින් මහජන ආරක්ෂක ආඥා පනතේ 2 වෙනි වගන්තිය යටතේ ගැසට් පත්‍රයක් මගින් ප්‍රකාශයට පත් කරනු ලැබිය හැකි ය. එම ගැසට් නිවේදනය මගින් මහජන ආරක්ෂක ආඥා පනතේ II වෙන කොටස සහ හදිසි අවස්ථා නියෝග බලාත්මක වෙයි.<br>**අංක 2464/30 දරන ගැසට් පත්‍රය** (2025 නොවැම්බර් 28 දිනැති)[8] මගින් දිවයින පුරා මහජනා ආරක්ෂක ආඥා පනතේ II වෙනි කොටස ක්‍රියාත්මක වන බව ප්‍රකාශයට පත් කරන ලදී. |
| පාලනය කරන ආයතන | • **ව්‍යසන කළමනාකරණය සඳහා වූ ජාතික සභාව**, 2 වෙනි වගන්තිය මගින් පිහිටුවන ලද අතර, ජනාධිපතිවරයා එහි සභාපතීත්වය දරයි, එය ප්‍රතිපත්ති අධීක්ෂණය කිරීම සඳහා පිහිටුවා ඇත.<br>• **ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය,** 8 වෙනි වගන්තිය මගින් පිහිටුවා ඇති අතර, ජාතික සැලසුම් ක්‍රියාත්මක කිරීමේ සහ අමාත්‍යාංශ සහ ආයතන සම්බන්ධීකරණය කිරීමේ වගකීම දරයි.<br>• **තාක්ෂණ උපදේශක කමිටු,** ව්‍යසන කළමනාකරණය සඳහා වූ ජාතික සභාවට සහ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට සහාය වීම සඳහා 9 වෙනි වගන්තිය යටතේ පත් කරනු ලැබිය හැකි ය. | • **නිසි බලධාරීන්:** හදිසි අවස්ථා නියෝග මගින් පවරා ඇති බලතල ක්‍රියාත්මක කිරීම සඳහා එම නියෝගවල 5 වෙනි වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබේ.<br>• **අත්‍යාවශ්‍ය සේවා කොමසාරිස් ජෙනරාල්**: අත්‍යාවශ්‍ය සේවා සම්බන්ධීකරණය කිරීම සඳහා සහ බලධාරීන් මෙහෙයවීම සඳහා නියෝගවල 11(1) වෙනි උපවගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබේ (අංක 2464/32 දරන ගැසට් පත්‍රය, 2025 නොවැම්බර් 29).[9]<br>ව්‍යසන කළමනාකරණය සඳහා වන ජාතික සභාව සහ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වැනි පවතින ආයතන හදිසි අවස්ථා නියෝග වලට අනුකූල වන අවස්ථාවල පමණක් ක්‍රියාත්මක වේ. |
| මෙහෙයුම් කිරීමේ බලතල | ව්‍යසන කළමනාකරණ පනත මගින් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට ජාතික සැලසුම් ක්‍රියාත්මක කිරීමේ සහ ආපදා ප්‍රතිචාර සම්බන්ධීකරණය කිරීමේ බලය පවරයි (8(2)(ආ) වගන්තිය). අමාත්‍යාංශ සහ සංස්ථා විසින් සැලසුම් සකස් කර, ආපදා තත්ත්වය ප්‍රකාශයට පත් කළ විට | හදිසි අවස්ථා නීති නියෝග මගින් බලහත්කාරයෙන් මෙහෙයුම් සිදුකිරීමේ බලතල සපයා දෙයි:<br>• 8(1) වෙනි නියෝගය: ආපදා සහන සඳහා පරිශ්‍රයන් අධිග්‍රහණය කිරීම; සන්නද්ධ හමුදාවල නිලධාරීන්ට අත්අඩංගුවට ගැනීමේ බලතල ලබා දෙයි. |

[8]https://documents.gov.lk/view/extra-gazettes/2025/11/2464-30_E.pdf
[9]https://documents.gov.lk/view/extra-gazettes/2025/11/2464-32_E.pdf

| | | |
|---|---|---|
| | ඒවා ක්‍රියාත්මක කළ යුතු ය; එහෙත් මෙම පනත මගින් සෘජුව ම බලහත්කාරයෙන් බලාත්මක කිරීම සඳහා අනිවාර්ය සේවය, දේපළ බලෙන් ලබා ගැනීම හෝ අනුගම්‍ය නියෝග සඳහා අවසර නොදෙ යි. | • 9 වෙනි නියෝගය: නිසි බලධාරියා විසින් ජාතික ආරක්ෂාව හෝ අත්‍යවශ්‍ය සේවා සඳහා වාහන අධිග්‍රහණය කරනු ලැබිය හැකි ය.<br>• 10 වෙනි නියෝගය: ජාතික ආරක්ෂාව හෝ අත්‍යාවශ්‍ය සේවා පවත්වාගෙන යාම සඳහා ආධාර වශයෙන් පුද්ගලයන්ට යම් වැඩක් කිරීමට හෝ පුද්ගලික සේවාවක් සපයා දීමට ජනාධිපතිවරයා විසින් නියම කරනු ලැබිය හැකි ය; එයට අනුකූල නොවීම වරදක් වේ.<br>• 12 වෙනි නියෝගය: ජනාධිපතිවරයාට ඕනෑම සේවාවක් අත්‍යවශ්‍ය සේවාවක් ලෙස ප්‍රකාශයට පත් කළ හැකි අතර, එමගින් එම සේවාවෙහි නිරතව සිටින කාර්ය මණ්ඩල අධිග්‍රහණය කිරීමට අවසර ලබා දෙයි.<br>• 48 වෙනි නියෝගය: ජනාධිපතිවරයා විසින් සාමාන්‍ය නීතිය යටතේ දිස්ත්‍රික් ලේකම්වරුන්ට පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමේ බලය සහිත සම්බන්ධීකරණ නිලධාරීන් සහ ප්‍රධාන සම්බන්ධතා නිලධාරීන් පත් කරනු ලැබිය හැකි ය. |
| බලාත්මක කිරීම සහ වැරදි | 24 වෙනි වගන්තිය: පනතට හෝ නියෝග වලට අනුකූල නොවීම සම්බන්ධ වැරදි සහ දඬුවම් (උදා: ව්‍යවස්ථාපිත රාජකාරිවලට එරෙහි වැරදි) සාමාන්‍ය නෛතික ක්‍රියා පටිපාටි හරහා ක්‍රියාත්මක වේ; දඬුවම් පනත යටතේ පනවනු ලබන දඩ හෝ වෙනත් දණ්ඩනයන්ට සීමා වේ. | හදිසි අවස්ථා නියෝගවලට නිශ්චිත වැරදි සහ දණ්ඩන ඇතුළත් වේ:<br>• 16 වෙනි නියෝගය: නිශ්චිත සඳහන් කර ඇති දණ්ඩ නීති සංග්‍රහයේ වගන්ති යටතේ වන වැරදි සඳහා වරෙන්තුවක් නොමැතිව සෝදිසි කිරීමේ සහ අත්අඩංගුවට ගැනීමේ බලතල.<br>• 24 - 28 නියෝග: බලධාරීන්ට විරෝධය දැක්වීම හෝ බාධා කිරීම හෝ යටිතල පහසුකම් වලට හානි කිරීම සඳහා වන වැරදි.<br>• 29 වෙනි නියෝගය: හදිසි අවස්ථා නියෝග උල්ලංඝනය කිරීම සඳහා දඬුවම් (නියම කරනු ලබන පරිදි සිරගත කිරීම සහ දඩ මුදල්). |
| නෛතික ආරක්ෂණ | 23 වගන්තිය මගින් පනත යටතේ සද්භාවයෙන් කටයුතු කරන නිලධාරීන්ව ආරක්ෂා කරයි. | 49 වෙනි නියෝගය: ජනාධිපතිවරයාගේ අනුමැතිය මත හැර, හදිසි අවස්ථා නියෝග යටතේ සද්භාවයෙන් සිදුකරන ලද ක්‍රියාවන් සඳහා සිවිල් හෝ අපරාධ නඩු පැවරිය නොහැක. |

| | | |
|---|---|---|
| කාල පථය සහ කාලසීමාව | ව්‍යසන කළමනාකරණ පනත **ස්ථිර ව්‍යවස්ථාපිත** නීතියක් වේ; විශේෂ විධිවිධාන (ආපදා තත්ත්වය) පාර්ලිමේන්තු අධීක්ෂණයට සහ ස්ථාවර කාල සීමාවන්ට යටත් වේ (පාර්ලිමේන්තුව විසින් දීර්ඝ කරනු ලැබිය හැකි මාස දෙකක කාල සීමාවන්ට). | මහජන ආරක්ෂක ආඥා පනතේ හදිසි අවස්ථා තන්ත්‍රය තාවකාලික වේ; ජනාධිපතිවරයා විසින් මහජන හදිසි අවස්ථාවක් ප්‍රකාශයට පත් කිරීමෙන් පසුව හදිසි අවස්ථා නියෝග ක්‍රියාත්මක වන අතර, අදාළ කාලය අවසන් වූ විට හදිසි අවස්ථා නියෝග ක්‍රියාත්මක වීම අවසන් වේ. මහජන ආරක්ෂක ආඥා පනතේ 2(2) වගන්තිය මගින් එහි II වෙනි කොටස මාසයක් දක්වා ක්‍රියාත්මක වීමට විධිවිධාන සලසා ඇති අතර, නැවත නිවේදනයක් නිකුත් කිරීම මගින් එය තවදුරටත් දීර්ඝ කළ හැකි ය. |

## 2. නිකුත් කර ඇති අතිවිශේෂ ගැසට් පත්‍ර

- **අංක 2464/30 දරන ගැසට් පත්‍රය[10], 2025 නොවැම්බර් 28:** ආරක්ෂාවට, මහජන සාමයට සහ ප්‍රජාවගේ ජීවිතයට අත්‍යාවශ්‍ය සැපයුම් සහ සේවා පවත්වාගෙන යාමට බලපාන මහජන හදිසි තත්ත්වයක් පවතින්නේ යන පදනමින්, 2025 නොවැම්බර් මස 28 වෙනි දින සිට බලපැවැත්වෙන පරිදි ශ්‍රී ලංකාව පුරා *මහජන ආරක්ෂක ආඥා පනතේ* II වෙනි කොටස ක්‍රියාත්මක කරමින් ජනාධිපතිවරයා විසින් එම ආඥා පනතේ 2 වෙනි වගන්තිය යටතේ ප්‍රකාශනයක් නිකුත් කරන ලදී.

- **අංක 2464/31 දරන ගැසට් පත්‍රය[11], 2025 නොවැම්බර් 28:** ජනාධිපතිවරයා විසින් මහජන ආරක්ෂක ආඥා පනත යටතේ ජනාධිපතිවරයාට, බලයලත් අමාත්‍යවරුන්ට, අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජෙනරාල්වරයාට සහ අනෙකුත් නම් කරන ලද නිලධාරීන්ට හදිසි අවස්ථා කාල සීමාව තුළ මහජන ආයතන වලට සහ සේවා සපයන්නන්ට අනුගම්‍ය නියෝග නිකුත් කිරීමට, සහයෝගීතාවය සහ තොරතුරු සපයා දෙන ලෙස නියම කිරීමට, ඉන්ධන, ආහාර, විදුලිය සහ ජලය වැනි අත්‍යාවශ්‍ය භාණ්ඩ බෙදා හැරීම පාලනය කිරීමට, සහ අත්‍යාවශ්‍ය සේවා බිඳවැටීම වළක්වා ගැනීමට අවශ්‍ය පියවර ගැනීම සඳහා තාවකාලික බලතල ලබා දෙන 2025 අංක 1 දරන හදිසි අවස්ථා (විවිධ විධිවිධාන සහ බලතල) නියෝග පනවන ලදී.

- **අංක 2464/29 දරන ගැසට් පත්‍රය[12], 2025 නොවැම්බර් 28:** විදුලි බලය සැපයීම, ඛනිජ තෙල් සහ ගෑස් බෙදා හැරීම, රෝහල් සහ රැකවරණ සේවා, මගීන් හෝ බඩු ප්‍රවාහනය සඳහා වූ පොදු ගමනාගමන සේවා, මංමාවත්, දුම්රිය මාර්ග, ගුවන් මගින් ප්‍රවාහනය කිරීම සහ සංචාරක සේවා යටිතල පහසුකම්, ජලය සහ ජලාපවහනය, ආහාර හා අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය සැපයීම, ප්‍රධාන ක්ෂේත්‍ර නිලධාරීන් (ප්‍රාදේශීය ලේකම්වරුන්, ග්‍රාම නිලධාරීන්, සමෘද්ධි සංවර්ධන නිලධාරීන්, කෘෂිකර්ම සහ ප්‍රජා නිලධාරීන්), ගිලන් රථ සේවා, මහ බැංකුව ඇතුළු සියලු ම රාජ්‍ය බැංකු හා රක්ෂණ සේවා, ජලය, විදුලිය, ජලාපවහනය, මලාපවහන, කසළ එකතු කිරීම සහ ගිනි නිවන සහ ගිලන් රථ සේවා ඇතුළු පළාත් පාලන ආයතන සේවා, වාරිමාර්ග සේවා, විදුලි සංදේශ සහ මාධ්‍ය සේවා, පහත් බිම් ගොඩකිරීම සහ සංවර්ධනය කිරීම, සහ කෘෂි සහ කෘෂි රක්ෂණ සේවා දිට්වා සුළි කුණාටුව හේතුවෙන් ඇති වූ දැඩි අහිතකර කාලගුණ තත්ත්වය තුළ අත්‍යාවශ්‍ය මහජන සේවා ලෙස ප්‍රකාශයට පත් කරමින් සහ මෙම සේවාවන්ට කවර හෝ ආකාරයකින් බාධා කිරීම පනත යටතේ වන වරදක් බවට පත් කරමින් 1979 අංක 61 දරන අත්‍යාවශ්‍ය මහජන සේවා පනත යටතේ ජනාධිපතිවරයා විසින් නියෝගයක් නිකුත් කරන ලදී.

---

[10] https://documents.gov.lk/view/extra-gazettes/2025/11/2464-30_E.pdf
[11] https://documents.gov.lk/view/extra-gazettes/2025/11/2464-31_E.pdf
[12] https://documents.gov.lk/view/extra-gazettes/2025/11/2464-29_E.pdf

- **අංක 2464/32 දරන ගැසට් පත්‍රය[13], 2025 නොවැම්බර් 29:** හදිසි අවස්ථා නියෝග යටතේ ජනාධිපතිවරයා විසින් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරියෙකු වන බී.කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති මහතා අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්වරයා ලෙස පත් කරන ලද අතර, එමගින් රට පුරා අත්‍යවශ්‍ය සේවා සැපයීමට, ඒවායෙහි අඛණ්ඩත්වයට සහ ඒවා පවත්වාගෙන යාමට සම්බන්ධ සියලු කටයුතු සම්බන්ධීකරණය කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට ඔහුට බලය පවරන ලදී

- **අංක 2465/08 දරන ගැසට් පත්‍රය[14], 2025 දෙසැම්බර් 02:** දිට්වා සුළි කුණාටුව හේතුවෙන් ඇති වූ නායයෑම් සහ ගංවතුර තත්ත්වයෙන් බලපෑමට ලක් වූ ප්‍රදේශවල මරණ ලියාපදිංචි කිරීම, පරිපාලන ලේඛනගත කිරීම් සහ සහන සපයා දීම සඳහා පහසුකම් සැලසීම පිණිස රෙජිස්ට්‍රාර් ජෙනරාල්වරයා විසින් 2010 අංක 19 දරන *මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) පනත* යටතේ මහනුවර, නුවරඑළිය, බදුල්ල, කුරුණෑගල, මාතලේ, කෑගල්ල, ගම්පහ, කොළඹ, මුලතිව්, යාපනය, පොළොන්නරුව, මන්නාරම, පුත්තලම, රත්නපුර, මොණරාගල, මඩකලපුව, අම්පාර, ත්‍රිකුණාමලය, කිලිනොච්චිය, වවුනියාව සහ කළුතර ඇතුළු **පරිපාලන දිස්ත්‍රික්ක 22 ක් ජාතික ආපදා බලපෑමට ලක් වූ ප්‍රදේශ** ලෙස ප්‍රකාශයට පත් කරන ලදී.

- **අංක 2465/16 දරන ගැසට් පත්‍රය[15], 2025 දෙසැම්බර් 04:** දිට්වා සුළි කුණාටුවෙන් පීඩාවට පත් ජනතාවට උපකාර කිරීම පිණිස "ආපදාවෙන් නැවත යථා තත්ත්වයට පත්කිරීමේ ව්‍යාපෘති" සඳහා ආධාර හෝ පරිත්‍යාග ලෙස ලැබෙන අත්‍යාවශ්‍ය භාණ්ඩ ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයාට හෝ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජෙනරාල්වරයාට භාර කර, රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අනුමත කර, ඒවායේ අපේක්ෂිත අරමුණ සඳහා බෙදා දෙන තෙක් වගකීම භාර ගෙන සිටින්නේ නම් සහ එම භාණ්ඩ භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව විකණීම, පවරා දීම, හෝ බැහැර කිරීම සිදු නොකරන්නේ නම්, එවැනි භාණ්ඩ ආනයනය කිරීම විශේෂ වෙළඳ භාණ්ඩ බද්දෙන් නිදහස් කරමින් මුදල් අමාත්‍යාංශය 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියෝගයක් නිකුත් කළ අතර, එම බදු නිදහස් කිරීම 2025 දෙසැම්බර් 5 වෙනි දින සිට වසරක කාලයක් සඳහා වලංගු වේ.

- **අංක 2467/51 දරන ගැසට් පත්‍රය[16], 2025 දෙසැම්බර් 17:** මහජන ආරක්ෂක ආඥා පනතේ II කොටස ක්‍රියාත්මක කිරීම සඳහා 2025 දෙසැම්බර් 5 වෙනි දින ජනාධිපතිවරයා නිකුත් කළ ප්‍රකාශනය පාර්ලිමේන්තුව විසින් විධිමත් ලෙස අනුමත කරන ලද අතර, එමගින් 2025 නොවැම්බර් මස 28 වෙනි දින සිට රජය විසින් ක්‍රියාත්මක කරන ලද හදිසි අවස්ථා බලතල සඳහා ව්‍යවස්ථාමය සහ පාර්ලිමේන්තු වලංගුභාවය ලබා දෙන ලදී.

- **අංක 2468/30 දරන ගැසට් පත්‍රය[17], 2025 දෙසැම්බර් 26:** පවතින හදිසි අවස්ථා තත්ත්වය අතරතුර කොළඹ, ගම්පහ, මහනුවර, යාපනය, ගාල්ල, ත්‍රිකුණාමලය සහ මඩකලපුව ඇතුළු අනෙකුත් පරිපාලන දිස්ත්‍රික්ක ගණනාවක් පුරා මෙන්ම ඒවාට යාබද දේශීය ජල තීරයෙහි ද මහජන සාමය පවත්වා ගැනීම සඳහා සිවිල් බලධාරීන්ට සහාය වීම පිණිස 2025 දෙසැම්බර් 27 වන දින සිට බලපැවැත්වෙන පරිදි මහජන ආරක්ෂක ආඥා පනතේ 12 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා යුධ හමුදාව, නාවික හමුදාව සහ ගුවන් හමුදාව කැඳවීමට ජනාධිපතිවරයා අවසර දුන්නේ ය.

- **අංක 2468/45 දරන ගැසට් පත්‍රය[18], 2025 දෙසැම්බර් 28:** පවතින අයහපත් කාලගුණ සහ ආපදා තත්ත්වයන් තුළ හදිසි අවස්ථා බලතල සහ මහජන සාමය පිළිබඳ ක්‍රියාමාර්ග

---

[13] https://documents.gov.lk/view/extra-gazettes/2025/11/2464-32_E.pdf
[14] https://documents.gov.lk/view/extra-gazettes/2025/12/2465-08_E.pdf
[15] https://documents.gov.lk/view/extra-gazettes/2025/12/2465-16_E.pdf
[16] https://documents.gov.lk/view/extra-gazettes/2025/12/2467-51_E.pdf
[17] https://documents.gov.lk/view/extra-gazettes/2025/12/2468-30_E.pdf
[18] https://documents.gov.lk/view/extra-gazettes/2025/12/2468-45_E.pdf

අඛණ්ඩව පවත්වාගෙන යාම සහතික කිරීම සඳහා ජනාධිපතිවරයා විසින් මහජන ආරක්ෂක ආඥා පනතේ 2 වෙනි වගන්තිය යටතේ ශ්‍රී ලංකාව පුරා මහජන හදිසි තත්ත්වයක් ප්‍රකාශයට පත් කර, එම ආඥා පනතේ II වෙනි කොටස රට පුරා ක්‍රියාත්මක කරන ලදී.

- **අංක 2468/46 දරන ගැසට් පත්‍රය[19], 2025 දෙසැම්බර් 28:** පවතින ආපදාවෙන් යථා තත්ත්වයට පැමිණීමේ කාලය තුළ අතිශය වැදගත් වන සේවා අඛණ්ඩව සපයාදීම නීත්‍යානුකූලව ශක්තිමත් කිරීම පිණිස ජනාධිපතිවරයා විසින් *1979 අංක 61 දරන අත්‍යවශ්‍ය මහජන සේවා පනත* යටතේ විදුලිය, ඉන්ධන, ජලය, සෞඛ්‍ය සේවා, පොදු ප්‍රවාහනය, මහාමාර්ග, වරාය, ආහාර සැපයුම්, බැංකු සහ රක්ෂණ, විදුලි සංදේශ, කෘෂිකර්මාන්ත, වාරිමාර්ග, පළාත් පාලන සේවා සහ හදිසි සේවා අත්‍යවශ්‍ය මහජන සේවා ලෙස නැවත ප්‍රකාශයට පත් කරන ලදී.

- **අංක 2469/09 දරන ගැසට් පත්‍රය[20], 2025 දෙසැම්බර් 31:** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වන වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් '**ශ්‍රී ලංකාව නැවත ගොඩනැගීම සඳහා වූ ජනාධිපති කාර්ය සාධක බලකාය**' (Presidential Task Force for Rebuilding Sri Lanka) ස්ථාපනය කරන ලද අතර, එම කාර්ය සාධක බලකායට උපායමාර්ගික නායකත්වය සැපයීම, රට පුරා පශ්චාත් ආපදා පුනරුත්ථාපනය, යථා තත්ත්වයට පත් කිරීම සහ ප්‍රතිසංස්කරණය සම්බන්ධීකරණය කිරීම, මූලික සේවා, යටිතල පහසුකම්, නිවාස, ජීවනෝපාය සහ ප්‍රාදේශීය ආර්ථික නැවත ස්ථාපනය කිරීම අධීක්ෂණය කිරීම, Rebuilding Sri Lanka අරමුදල ඇතුළු අරමුදල් කළමනාකරණය කිරීම, දත්ත සහ තීරණ-සහාය පද්ධති ස්ථාපිත කිරීම, ආංශික උප කමිටු පත් කිරීම සහ ජනාධිපතිවරයාට වරින් වර ප්‍රගතිය වාර්තා කිරීම යන කාර්යයන් පවරා ඇත.

## 3. Cabinet Decisions

- **2025 දෙසැම්බර් 01[21] - "Rebuilding Sri Lanka අරමුදල" ස්ථාපනය කිරීම (මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය):** දිට්වා සුළි කුණාටුවෙන් පසු පුනරුත්ථාපනය, යථා තත්ත්වයට පත් කිරීම සහ ප්‍රතිසංස්කරණය සඳහා මුදල් සැපයීම සඳහා ම වෙන්වූ **Rebuilding Sri Lanka** නැමති අරමුදලක් පිහිටුවීමට අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබා දුන්නේ ය. මෙම අරමුදල ජනාධිපති ලේකම් කාර්යාලය යටතේ ව්‍යවස්ථාපිත අරමුදලක් ලෙස පිහිටුවා ඇති අතර, ඒ සඳහා ම නම් කරන ලද වෙනම ම ගිණුමකට දේශීය හා විදේශීය පරිත්‍යාගශීලීන්ගේ දායක මුදල් ලබා ගැනීමට මෙම අරමුදලට බලය ඇත. මේ සඳහා අවශ්‍ය කරන මූලික ප්‍රාග්ධනය භාණ්ඩාගාර අරමුදල් වලින් ලබා දී ඇති අතර එය මේ වන විටත් ශ්‍රී ලංකා මහ බැංකුවට ලබා දී ඇත. ආපදාවෙන් පීඩාවට පත් ප්‍රදේශවල නිවාස, පොදු යටිතල පහසුකම්, කෘෂිකර්මාන්තය, ධීවර කටයුතු, ජීවනෝපාය සහ අත්‍යාවශ්‍ය සේවා යථා තත්ත්වයට පත් කිරීම සඳහා සහාය වීම මෙම අරමුදලට පැවරී ඇති කාර්ය භාරය වේ.

- **2025 දෙසැම්බර් 01[22] - හදිසි ආපදා තත්ත්වයෙන් පීඩාවට පත් වී ඇති පුද්ගලයන් සඳහා කඩිනමින් සහන සැලසීම (මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය):** දිට්වා සුළි කුණාටුව හේතුවෙන් ඇති වූ ආපදා කාලය 2025 නොවැම්බර් 21 වෙනි දින සිට ආරම්භ වන බව හඳුනා ගනිමින්, එම ආන්තික කාලගුණ තත්ත්වයන්ගෙන් පීඩාවට පත් වූ පුරවැසියන් සඳහා කඩිනම් සහන සැලසීමේ ක්‍රියාමාර්ග ගැනීම අමාත්‍ය මණ්ඩලය අනුමත කළේ ය. සහන මෙහෙයුම් සඳහා රු.මි. 550 ක අතිරේක අයවැය ප්‍රතිපාදන අනුමත කරන ලදී. පවුලේ සාමාජිකයන් සංඛ්‍යාව අනුව, පවුලකට සතියකට ලබා දෙන වියළි සලාක ආධාර මුදල කලින් පැවති පරාසය වූ රු. 1,800 - 3,600 සිට රු. 2,100 - 10,500 දක්වා වැඩි කරන ලදී. අවශ්‍ය අනුමැතීන් ලබා දීමේ සහ මෙහෙයුම් මාර්ගෝපදේශ නිකුත් කිරීමේ බලය

[19] https://documents.gov.lk/view/extra-gazettes/2025/12/2468-46_E.pdf
[20] https://documents.gov.lk/view/extra-gazettes/2025/12/2469-09_E.pdf
[21] https://www.dgi.gov.lk/images/2025/12/Cabinet_Decisions_on_01.12.2025_E.pdf
[22] https://www.dgi.gov.lk/images/2025/12/Cabinet_Decisions_on_01.12.2025_E.pdf

භාණ්ඩාගාර ලේකම්වරයාට පවරා දී ඇති අතර, එම වැඩසටහන් මගින් හදිසි සහන, තාවකාලික ආධාර සහ බලපෑමට ලක් වූ ප්‍රජාවන්ගේ ජීවන තත්ත්වයන් කඩිනමින් සාමාන්‍ය තත්ත්වයට පත් කිරීම ආවරණය කරනු ලැබේ.

- **2025 දෙසැම්බර් 10[23] - ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයේ ආපදා සහන ණය වැඩසටහන් එක් රාමුවක් යටතට ඒකාබද්ධ කර ක්‍රියාත්මක කිරීම (RE-MSME PLUS) (මුදල්, ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය):** ආපදා තත්ත්වයෙන් පසු **ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය යථා තත්ත්වයට පත් කිරීමට** සහාය වීම සඳහා **RE-MSME PLUS** නැමති ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබා දුන්නේය. මෙම යෝජනා ක්‍රමය මගින් පෙර පැවති SMILE-III, E-FRIEND-II සහ RE-MSME ඇතුළු ණය වැඩසටහන් ඒකාබද්ධ කරන අතර, 130,000 ක් පමණ ව්‍යවසායකයින්ට එයින් ප්‍රතිලාභ සැලසෙනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ. සියයට 3 ක (3%) වාර්ෂික පොලී අනුපාතයක් යටතේ, මාස හයක සහන කාලයක් සහිතව, වසර තුනකින් ආපසු ගෙවීමේ පදනම මත මෙම ණය ලබා දෙනු ලැබේ. ව්‍යාපාර යථා තත්ත්වයට පත් කර ගැනීම සඳහා ක්ෂණික කාරක ප්‍රාග්ධනය සපයා දීම පිණිස ක්ෂුද්‍ර ව්‍යවසාය සඳහා රු. 250,000 ක ද, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සඳහා රු. 1,000,000 ක ද උපරිමයකට යටත්ව මෙම ණය ලබා දෙන ලැබේ.

- **2025 දෙසැම්බර් 10[24] - අපදාවෙන් බලපෑමට ලක් වූ ආගමික ස්ථාන පිරිසිදු කිරීම සහ එම ස්ථාන වලට සහාය දීම (බුද්ධ ශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය):** දිට්වා සුළි කුණාටුවෙන් බලපෑමට ලක් වූ ආගමික ස්ථාන ප්‍රතිසංස්කරණය කිරීම සඳහා මූල්‍ය ආධාර සැපයීමට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා දුන්නේ ය. පිරිසිදු කිරීමේ වියදම් පියවා ගැනීමට සහ ආගමික කටයුතු නැවත ආරම්භ කිරීමට හැකිවන පරිදි බලපෑමට ලක් වූ සෑම ආගමික ස්ථානයකට ම මේ යටතේ රු. 25,000 ක මුදලක් හිමිවේ. ප්‍රජාව සාමාන්‍ය තත්ත්වයට පත්කිරීම සහ ආගමික වතාවත් අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා සහාය දීමේ අරමුණ ඇතිව මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අමාත්‍යාංශයට අයවැය ප්‍රතිපාදන වෙන් කරන ලදී.

- **2025 දෙසැම්බර් 10[25] - ලෝක බැංකු අරමුදල් යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති භාවිතා කරමින් හදිසි ප්‍රතිචාර සංරචක සක්‍රීය කිරීම (මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය):** දිට්වා සුළි කුණාටුව හේතුවෙන් ඇතිවූ ගංවතුර සහ නායයෑම් වලින් පසු යථා තත්ත්වයට පත්කිරීමේ ක්‍රියාකාරකම් වලට සහාය වීම සඳහා ලෝක බැංකු අරමුදල් යටතේ දැනට ක්‍රියාත්මක වන ව්‍යාපෘති භාවිතා කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී. මේ සඳහා වන සම්පූර්ණ අරමුදල් ප්‍රමාණය එ.ජ.ඩො.මි. 92-112 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. මෙම අරමුදල් විශේෂයෙන් ම ආපදාවන්ට ලක්වන සහ දැඩි ලෙස බලපෑමට ලක්වී ඇති ප්‍රදේශවල හානියට පත් මාර්ග, පාලම්, පොදු ගොඩනැගිලි සහ අනෙකුත් අතිශය වැදගත් යටිතල පහසුකම් කඩිනමින් පුනරුත්ථාපනය කිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම සඳහා භාවිතා කිරීමට නියමිතය.

- **2025 දෙසැම්බර් 10[26] - ආසියා පැසිෆික් ආපදා ප්‍රතිචාර අරමුදලෙන් ප්‍රදානයක් ලබා ගැනීම (මුදල්, ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය):** ආසියානු සංවර්ධන බැංකුවේ ආසියා පැසිෆික් ආපදා ප්‍රතිචාර අරමුදලෙන් එ.ජ.ඩො.මි. 3.0 ක ප්‍රදානයක් ලබා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා දෙන ලදී. මෙම ප්‍රදානය කඩිනම් සහන මෙහෙයුම් සඳහා අවශ්‍ය මුදල් සපයා ගැනීමට සහ දිට්වා සුළි කුණාටුව හේතුවෙන් පීඩාවට පත් ප්‍රජාවන් සඳහා අත්‍යාවශ්‍ය සේවා පවත්වාගෙන යාමට යොදා ගනු ලැබේ. ආසියානු සංවර්ධන බැංකුව සමග අදාළ ගිවිසුම් සකස් කර අවසන් කිරීමට සහ අත්සන් කිරීමට අවසර ලබා දෙන ලදී.

---

[23] https://www.dgi.gov.lk/images/2025/12/11/Cabinet_Decision_on_10.12.2025_English.pdf
[24] https://www.dgi.gov.lk/images/2025/12/11/Cabinet_Decision_on_10.12.2025_English.pdf
[25] https://www.dgi.gov.lk/images/2025/12/11/Cabinet_Decision_on_10.12.2025_English.pdf
[26] https://www.dgi.gov.lk/images/2025/12/11/Cabinet_Decision_on_10.12.2025_English.pdf

- **2025 දෙසැම්බර් 29**[27] **- විස්තීර්ණ ආපදා සහන ණය යෝජනා ක්‍රමය (පුළුල් කළ ආවරණය) (මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය):** මධ්‍යම හා මහා පරිමාණ ව්‍යවසායන් ඇතුළුව ආපදා වලින් පීඩාවට පත් සියලු ම ව්‍යවසායකයින් ඇතුළත් කිරීම පිණිස පවතින RE-MSME ආපදා සහන ණය යෝජනා ක්‍රමය පුළුල් කිරීමට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා දී ඇත. සියයට 3 ක (3%) වාර්ෂික පොලී අනුපාතයක් යටතේ මාස හයක සහන කාලයක් සහිතව වසර තුනකින් ආපසු ගෙවීම සඳහා මෙම ණය සපයා දෙනු ලැබේ. උපරිම ණය මුදල ක්ෂුද්‍ර ව්‍යවසාය සඳහා රු. 250,000 ක් ද, සුළු පරිමාණ ව්‍යවසාය සඳහා රු.මි.1 ක් ද, මධ්‍යම හා මහා පරිමාණ ව්‍යවසාය සඳහා රු.මි. 25 ක් ද වේ. මෙම ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා රු.බි. 5 ක මුළු ප්‍රතිපාදනයක් අනුමත කරන ලදී.

## 4. Rebuilding Sri Lanka ජනාධිපති කාර්ය සාධක බලකාය

ශ්‍රී ලංකාව පුරා ජීවිත හානි, තුවාල සහ රාජ්‍ය හා පෞද්ගලික දේපළ වලට බරපතල හානි සිදු කළ දිට්වා සුළි කුණාටු හේතුවෙන් සිදු වූ පුළුල් විනාශයට ප්‍රතිචාර වශයෙන් ජනාධිපතිවරයා විසින් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වන ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද **2025 දෙසැම්බර් 31 දිනැති අංක 2469/09 දරන අති විශේෂ ගැසට් පත්‍රය**[28] මගින් ශ්‍රී ලංකාව නැවත ගොඩනැගීම සඳහා වූ **Rebuilding Sri Lanka ජනාධිපති කාර්ය සාධක බලකාය** විධිමත් ලෙස ස්ථාපනය කරන ලදී.

"**Rebuilding Sri Lanka**" රාමුව යටතේ ක්‍රියාත්මක කරනු ලබන සියලු ම පශ්චාත්-ආපදා පුනරුත්ථාපන, යථා තත්ත්වයට පත්කිරීමේ සහ ප්‍රතිසංස්කරණ වැඩසටහන් සඳහා උපායමාර්ගික නායකත්වය ලබා දීම, ජාතික සම්බන්ධීකරණය සිදු කිරීම, ඒකාබද්ධ ප්‍රවේශයක් සපයා දීම සහ සමස්ත අධීක්ෂණය සිදු කිරීම මෙම කාර්ය සාධක බලකායට පැවරී ඇත.

**සංයුතිය**
මෙම කාර්ය සාධක බලකාය පහත සඳහන් අය ඇතුළුව කැබිනට් අමාත්‍යවරුන්, ජ්‍යෙෂ්ඨ පළාත් ප්‍රධානීන්, ප්‍රධාන අමාත්‍යාංශවල ලේකම්වරුන් සහ ජ්‍යෙෂ්ඨ ජනාධිපති උපදේශකවරුන් ගෙන් සමන්විත වේ:

- අග්‍රාමාත්‍යවරිය (සභාපති)
- විදේශ කටයුතු; රාජ්‍ය පරිපාලන සහ පළාත් පාලන; කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග; ග්‍රාමීය සංවර්ධන සහ සමාජ ආරක්ෂණ; කර්මාන්ත සහ ව්‍යවසායකත්ව; ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන; සහ සෞඛ්‍ය සහ ජනමාධ්‍ය යන විෂයන් භාර අමාත්‍යවරු; කම්කරු අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍ය; පරිසර; සහ නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන යන විෂයයන් භාර අමාත්‍යවරු;
- බස්නාහිර පළාත් ආණ්ඩුකාර
- ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍ය
- ජනාධිපති ලේකම්
- මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්
- ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්
- අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්
- ජ්‍යෙෂ්ඨ ජනාධිපති උපදේශක
- රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජෙනරාල්
- අතිරේකව නම් කරන ලද වෘත්තිකයන් සහ නීති විශේෂඥයන්

කාර්ය සාධක බලකායේ කැඳවුම්කරු/ලේකම්වරයා ලෙස **ජී.එම්.ආර්.ඩී. අපොන්සු** පත් කර ඇත.
**කාර්ය සාධක බලකායේ මූලික කාර්යයන්**

---

[27] https://www.dgi.gov.lk/images/2025/12/30/Cabinet_Decisions_on_29.12.2025_E.pdf
[28] https://www.dgi.gov.lk/images/2025/12/31/2469-09_E.pdf

කාර්ය සාධක බලකායට පහත සඳහන් වගකීම් පවරා ඇත:

- සමස්ත ප්‍රතිපත්ති මග පෙන්වීම සහ ජාතික මට්ටමෙන් නැවත ගොඩනැගීම සඳහා උපායමාර්ගික තීරණ ගැනීම.
- අමාත්‍යාංශ අතර සම්බන්ධීකරණයට අදාළ ගැටළු විසඳීම.
- ප්‍රධාන අරමුදල් සැපයීම්, යථා තත්ත්වයට පත් කිරීම් සහ ප්‍රතිසංස්කරණ තේරීම් මෙහෙයවීම.
- යථා තත්ත්වයට පත්කිරීමේ සහ ප්‍රතිසංස්කරණය කිරීමේ ජාතික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම.

මෙම කාර්යයන් මගින් විශේෂයෙන් ම පහත සඳහන් ක්ෂේත්‍ර ආවරණය කරනු ලැබේ:

- මූලික අවශ්‍යතා, සනීපාරක්ෂාව සහ සෞඛ්‍ය සේවා නැවත ස්ථාපනය කිරීම.
- මූලික යටිතල පහසුකම් නැවත ගොඩනැගීම.
- ජීවනෝපාය සහ නිෂ්පාදක වත්කම් පුළුල් කිරීම.
- ප්‍රාදේශීය ආර්ථිකයන් නැවත ස්ථාපනය කිරීම.
- ඩිජිටල් දත්ත පද්ධති සහ තීරණ-සහාය යාන්ත්‍රණ ස්ථාපනය කිරීම.
- සන්නිවේදනය සහ පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වය වැඩිදියුණු කිරීම.

**බලතල සහ වාර්තා කිරීම**

කාර්ය සාධක බලකායේ සාමාජිකයන්ට පහත සඳහන් කාර්යයන් සඳහා බලය පවරනු ලැබේ:

- පවරා ඇති කාර්යයන් ඉටු කිරීම සඳහා අවශ්‍ය විමසීම් සිදුකිරීම සහ උපදෙස් නිකුත් කිරීම.
- රාජ්‍ය නිලධාරීන්ගෙන් සහ ආයතනවලින් සහාය ලබා ගැනීම.
- පවරා ඇති කාර්ය භාරයන් ක්‍රියාත්මක කිරීම පිළිබඳව ජනාධිපතිවරයාට වරින් වර ප්‍රගති වාර්තා ඉදිරිපත් කිරීම.

**අනු කමිටු පිහිටුවීමේ බලතල**

තීරණ ක්‍රියාවට නැංවීම සහ ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම සඳහා අදාළ අංශ භාර අමාත්‍යවරුන්ගේ සභාපතිත්වයෙන් යුත් අංශ-විශේෂිත **අනුකමිටු** පිහිටුවීමට කාර්ය සාධක බලකායට බලය ඇත.

පහත සඳහන් අනුකමිටු අවශ්‍ය බව ගැසට් පත්‍රයෙහි හඳුනාගෙන ඇත:

- **පශ්චාත් ආපදා අවශ්‍යතා ඇගයීම් කමිටුව**
  භෞතික හානි, ආර්ථික පාඩු සහ සමාජ බලපෑම් පිළිබඳ දත්ත රැස් කිරීමේ, විශ්ලේෂණය කිරීමේ සහ ඇගයීමේ වගකීම පැවරී ඇත.
- **පොදු යටිතල පහසුකම් ප්‍රතිස්ථාපනය කිරීමේ කමිටුව**
  ප්‍රවාහනය, විදුලිය, ජලය, වාරිමාර්ග, සෞඛ්‍ය, අධ්‍යාපනය සහ විදුලි සංදේශ පද්ධති යන සේවා පුනරුත්ථාපනය කිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම, සහ තාක්ෂණික ප්‍රමිතීන් සහ ආපදාවන්ට ඔරොත්තු දෙන ඉදිකිරීම් සහතික කිරීම අධීක්ෂණය කිරීමේ වගකීම පැවරී ඇත.
- **පීඩාවට ලත් වූ ප්‍රජාවන් සඳහා නිවාස ප්‍රතිස්ථාපනය කිරීමේ කමිටුව**
  නිවාස ප්‍රතිප්‍රාප්ති සැලැස්මක් සහ සංවිධානය කරගන්නා ලද තාක්ෂණික හා මූල්‍ය සම්පත් මත පදනම්ව, ආරක්ෂිත ප්‍රදේශවල සහ සේවා සපයා ඇති ප්‍රදේශවල නිවාස නැවත ගොඩනැගීමට හෝ ඉදිකිරීමට සහාය වීමේ වගකීම පැවරී ඇත.
- **ප්‍රාදේශීය ආර්ථිකයන් හා ජීවනෝපාය පුනර්ජීවනය කිරීමේ කමිටුව**
  ජීවනෝපායන් ස්ථාවර කිරීම, සැපයුම් දාම ප්‍රතිස්ථාපනය කිරීම, මූල්‍ය සඳහා ප්‍රවේශය වැඩිදියුණු කිරීම සහ ආර්ථිකය යථා තත්ත්වයට පත්කිරීමේ උපාය මාර්ග සකස් කිරීම සඳහා මග පෙන්වීමේ වගකීම පැවරී ඇත.
- **සමාජ යටිතල පහසුකම් ප්‍රතිස්ථාපනය පිළිබඳ කමිටුව**
  රෝග වැළැක්වීමේ කටයුතු සහ සහන කඳවුරුවල තත්ත්වයන් නිරීක්ෂණය කරන අතර ම, අධ්‍යාපන, සෞඛ්‍ය, ජල සැපයුම්, සනීපාරක්ෂක සහ සුභසාධන සේවා ප්‍රතිස්ථාපනය කිරීමේ කටයුතු සම්බන්ධීකරණය කිරීමේ වගකීම පවරා ඇත.

- **මූල්‍ය සහ අරමුදල් කමිටුව**
  Rebuilding Sri Lanka අරමුදල් පාලන කමිටුව ව්‍යවස්ථාපිත අරමුදලක් ලෙස විධිමත් කර, රටේ රාජ්‍ය මූල්‍ය රාමුව තුළ අරමුදල් රැස් කිරීම, අයවැයකරණය, පරිත්‍යාගශීලීන් සම්බන්ධීකරණය කිරීම, අරමුදල් වෙන් කිරීම සහ විනිවිදභාවයෙන් යුතු මූල්‍ය කළමනාකරණය සඳහා නිර්ණායක සකස් කිරීමේ වගකීම පැවරී ඇත.
- **දත්ත සහ තොරතුරු පද්ධති කමිටුව**
  ප්‍රමුඛතා හඳුනා ගැනීම, යථා තත්ත්වයට පත්කිරීමේ කටයුතු සැලසුම්කිරීම් මෙහෙයවීම, ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම සහ සාක්ෂි මත පදනම් වූ තීරණ ගැනීම සඳහා සහාය වීම පිණිස දත්ත වේදිකා සහ විශ්ලේෂණ පද්ධති ස්ථාපනය කිරීමේ වගකීම පැවරී ඇත.
- **මහජන සන්නිවේදන කමිටුව**
  සම්බන්ධීකරණය කරන ලද මහජන සන්නිවේදන සහ පාර්ශ්වකරුවන් සහභාගීකරවා ගැනීමේ උපාය මාර්ගයක් සකස් කර ක්‍රියාත්මක කිරීමේ වගකීම පැවරී ඇත.

දිට්වා සුළි කුණාටුව හේතුවෙන් සිදු වූ දැඩි හානියෙන් පසු රටපුරා සිදුකෙරෙන ප්‍රතිසංස්කරණ කටයුතු සම්බන්ධීකරණය කිරීම සඳහා "**Rebuilding Sri Lanka**" (ශ්‍රී ලංකාව නැවත ගොඩනැගීම) නැමති ජාතික වැඩසටහන **2026 ජනවාරි 13** වන දින ජනාධිපති අනුර කුමාර දිසානායක මහතාගේ ප්‍රධානත්වයෙන් කොළඹ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී නිල වශයෙන් දියත් කරන ලදී. මෙම දියත් කිරීම ජනාධිපති කාර්ය සාධක බලකායේ අධීක්ෂණ කාර්ය භාරයේ මෙහෙයුම්වල ආරම්භය සනිටුහන් කළ අතර, දැනට ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘති අවශ්‍ය පරිදි නැවත සකස් කර ගැනීම, **2026 වර්ෂය සඳහා රු. බිලියන 500 ක පරිපූරක ඇස්තමේන්තුවක්** යටතේ අතිරේක අයවැය සම්පත් නැවත වෙන් කිරීම සහ Rebuilding Sri Lanka අරමුදල හරහා දේශීය, විදේශීය, රාජ්‍ය සහ පෞද්ගලික පරිත්‍යාගශීලීන්ගේ සහාය ඒකරාශි කර ගැනීම ඇතුළත් බහුවිධ මූල්‍යකරණ උපාය මාර්ගයක් එයට ඇතුළත් විය.[29]

ප්‍රතිසංස්කරණ කටයුතුවලට අවශ්‍ය අරමුදල් සැපයීමට සහාය වීම පිණිස ජනාධිපති ලේකම් කාර්යාලය යටතේ **Rebuilding Sri Lanka නැමති ව්‍යවස්ථාපිත අරමුදලක්** පිහිටුවන ලද අතර, එම අරමුදල පරිපාලනය කිරීම, අවශ්‍යතා තක්සේරු කිරීම, ප්‍රමුඛතා නියම කිරීම, සම්පත් වෙන් කිරීම, යථා තත්ත්වයට පත්කිරීමේ කටයුතු සඳහා වියපැහැදම් කිරීම් අධීක්ෂණය කිරීම සහ විගණනය ඇතුළු මූල්‍ය මෙහෙයුම් විනිවිදභාවයෙන් යුතුව සිදු වන බව සහතික කිරීම සඳහා **2025 දෙසැම්බර් 01**[30] වෙනි දින අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය මත රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ නියෝජිතයින්ගෙන් සමන්විත **කළමනාකරණ කමිටුවක්** පත් කරන ලදී. **ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු** (සභාපති), **ජී.එම්.ආර්.ඩී. අපොන්සු** (කැඳවුම්කරු), **හනීෆ් යූසුෆ්, ආචාර්ය හර්ෂණ සූරියප්පෙරුම, දුමින්ද හුලංගමුව, සුගීෂ්වර ගුණරත්න, මොහාන් පණ්ඩිතගේ, ක්‍රිෂාන් බාලේන්ද්‍ර, ආචාර්ය පරාක්‍රම දිසානායක, අෂ්රොෆ් ඕමාර්** සහ **ඉෂාර නානායක්කාර** ඇතුළු තවත් අය එහි සාමාජිකයන් වේ.[31]

මහජන සහභාගීත්වයට, පරිත්‍යාගශීලීන් සම්බන්ධකර ගැනීමට සහ විනිවිදභාවය පවත්වා ගැනීම සඳහා පහසුකම් සැලසීම පිණිස, රජය **Rebuilding Sri Lanka අරමුදල අධීක්ෂණ කිරීමේ නිල වෙබ් අඩවිය ([www.rebuildingsrilanka.gov.lk](http://www.rebuildingsrilanka.gov.lk))** දියත් කළේය. මෙම වේදිකාව මගින් දේශීය සහ ජාත්‍යන්තර පරිත්‍යාගශීලීන්ට ඔවුන්ගේ මූල්‍ය දායකත්වයන් ලබා දීමට, ද්‍රව්‍ය, ඉඩම් සහ අනෙකුත් සම්පත් පරිත්‍යාග කිරීමට, සහ ඔවුන්ගේ දායකත්වයන්, ව්‍යාපෘතිවල ප්‍රගතිය, දිස්ත්‍රික්ක අනුව සිදු කෙරෙන ප්‍රතිසංස්කරණ කටයුතු, නිල නිවේදන සහ අරමුදල් භාවිතය ආදිය පිළිබඳ තොරතුරු පරීක්ෂා කර බැලීමට ඉඩ සලසා දෙයි.[32]

---

[29] https://www.presidentsoffice.gov.lk/rebuilding-sri-lanka-national-initiative-launched-under-the-patronage-of-the-president
[30] https://www.dgi.gov.lk/images/2025/12/Cabinet_Decisions_on_01.12.2025_E.pdf
[31] https://www.news.lk/news/management-committee-of-the-rebuilding-sri-lanka-fund-appointed-with-representatives-from-the-public-and-private-sectors
[32] https://www.presidentsoffice.gov.lk/online-portal-launched-to-provide-information-on-the-rebuilding-sri-lanka-national-programme

මෙම කාර්ය සාධක බලකායේ මෙහෙයුම් වැඩසටහන්වල කොටසක් ලෙස 2026 ජනවාරි 9 වෙනි දින රජය දිට්වා සුළි කුණාටුවෙන් නිවාස විනාශ වූ පවුල්වලට සහාය වීම සඳහා Rebuilding Sri Lanka වැඩසටහන යටතේ "**PROJECT 5M**" **නැමති නිවාස වන්දි සහ ඉදිකිරීම් වැඩසටහන** ආරම්භ කළේ ය. මෙම වැඩසටහන ආරම්භ කිරීමේ උත්සවය අනුරාධපුර දිස්ත්‍රික්කයේ පවත්වමින්, සම්පූර්ණයෙන් ම විනාශ වූ නිවාස සඳහා වන්දි ගෙවීම සහ නව නිවාස ඉදිකිරීම උත්සවාකාරයෙන් ආරම්භ කරන ලද අතර, 2026 ජාතික නිවාස වැඩසටහන යටතේ මේ වන විටත් සැලසුම් කර ඇති පරිදි **නිවාස 31,000** ට ආසන්න සංඛ්‍යාවක් ඉදිකිරීමට අමතරව අලුතින් තවත් **නිවාස 20,000 - 25,000** ක් පමණ අවශ්‍ය වනු ඇතැයි රජය ඇස්තමේන්තු කර ඇත.[33]

2026 ජනවාරි 26 වෙනි දින වන විට **Rebuilding Sri Lanka Fund** අරමුදල සමස්ත ලෙස **රු. 5,942,467,000** ක් සහ **එ.ජ.ඩො**. 9,982,703 ක් රැස් කර ඇත.[34]

## 5. අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජෙනරාල් කාර්යාලය

**2025 නොවැම්බර් මස අග** භාගයේ දී **දිට්වා සුළි කුණාටුව** සිදුවීමෙන් ඉනික්බිතව ම රට පුරා ක්‍රියාත්මක යථා තත්ත්වයට පත්කිරීමේ කටයුතු සම්බන්ධීකරණය කිරීම සඳහා සහ හදිසි තත්ත්වයන් යටතේ ජීවිත පවත්වා ගැනීමට අවශ්‍ය සේවා අඛණ්ඩව සපයාදීම සහතික කිරීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් **අත්‍යාවශ්‍ය සේවා කොමසාරිස් ජෙනරාල් කාර්යාලය**[35] පිහිටුවන ලදී. ආපදාවෙන් බලපෑමට ලක් වූ ප්‍රදේශවල ජනතාවට අත්‍යාවශ්‍ය සේවා නැවත ස්ථාපනය කිරීම සහ විවිධ ආයතන විසින් සිදුකරන ආපදා ප්‍රතිචාර සම්බන්ධීකරණය කිරීම සඳහා **අග්‍රාමාත්‍ය කාර්යාලය තුළ ක්‍රියාත්මක වන මධ්‍යම මෙහෙයුම් මධ්‍යස්ථානයක්** ලෙස මෙම කාර්යාලය ජනාධිපතිවරයා විසින් ස්ථාපනය කරන ලදී.

ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය; කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය; නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යාංශය; සහ ඒ ආශ්‍රිත ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව, මාර්ග සංවර්ධන අධිකාරිය, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, ලංකා විදුලිබල මණ්ඩලය සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුව වැනි ආයතන ඇතුළු ප්‍රධාන අංශ සහ රාජ්‍ය ආයතන විසින් දරනු ලබන ප්‍රයත්නයන් ත්‍රිවිධ හමුදාවන්හි සහාය ඇතිව සම්බන්ධීකරණය කිරීමේ වගකීම අත්‍යාවශ්‍ය සේවා කොමසාරිස් ජෙනරාල් **බී.කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති**[36] මහතා වෙත පවරන ලදී.

සුළි කුණාටුවෙන් බලපෑමට ලක් වූ ප්‍රජාවන්ට ආධාර සපයන සංවර්ධන හවුල්කරුවන්, රාජ්‍ය නොවන සංවිධාන සහ සිවිල් සමාජ සංවිධාන සමග සම්බන්ධීකරණය ශක්තිමත් කරන ලෙස අත්‍යාවශ්‍ය සේවා කොමසාරිස් ජෙනරාල්වරයා **2025 දෙසැම්බර් 8 දිනැති අංක CGES/2025/10 දරන නියෝගය**[37] මගින් සියලු ම දිස්ත්‍රික් ලේකම්වරුන්ට උපදෙස් දුන්නේ ය. ආධාර බෙදා හැරීමේ දී භූගෝලීය වශයෙන් විෂමතා පවතින බව මෙම නියෝගය මගින් වාර්තා කරන ලද අතර, එබැවින් අවශ්‍යතාවයන් තහවුරු කරගෙන, සහ බිම් මට්ටමේ තක්සේරු කිරීම් පදනම් කරගෙන සම්බන්ධීකරණ කටයුතු සිදුකරන ලෙස එමගින් නියෝග කරන ලදී. ස්ථාපිත නෛතික සහ ආයතනික යාන්ත්‍රණයන්ට අනුකූලව, දිස්ත්‍රික් මට්ටමේ ප්‍රමුඛතා හඳුනා ගැනීම, මැදිහත්වීම් ද්විගුණ වීම වැළැක්වීම සහ ඉහළ ප්‍රතිඵල සහිත ක්‍රියාකාරකම් සඳහා පහසුකම් සැලසීම පිණිස දිස්ත්‍රික් ලේකම්වරුන් අදාළ පාර්ශ්වකරුවන් සමග එක්ව කටයුතු කළ යුතු යැයි ද එමගින් නියෝග කර ඇත. සහන සැලසීම, පුනරුත්ථාපනය, ප්‍රතිසංස්කරණය සහ යථා තත්ත්වයට පත්කිරීම යන සියලු අදියර වල දී හවුල්කරුවන්ගේ සහභාගීත්වය අවශ්‍ය කරන බවත්, සම්බන්ධීකරණ වැඩපිළිවෙළ සහ මෙහෙයුම් අවහිරතා පිළිබඳ සමාලෝචනය කිරීම අග්‍රාමාත්‍ය කාර්යාලය සහ අදාළ රාජ්‍ය

[33] https://rebuildingsrilanka.gov.lk/article.php
[34] https://rebuildingsrilanka.gov.lk/
[35] https://documents.gov.lk/view/extra-gazettes/2025/11/2464-31_E.pdf
[36] https://documents.gov.lk/view/extra-gazettes/2025/11/2464-32_E.pdf
[37] https://civilsocietycollectiveforemergencyresponse.wordpress.com/wp-content/uploads/2025/12/ngo-coordination-1.pdf

ආයතන සමග සහයෝගයෙන් යුතුව අත්‍යාවශ්‍ය සේවා කොමසාරිස් ජෙනරාල් කාර්යාලය හරහා සිදුකරනු ලබන බවත් එම නියෝගය මගින් වැඩිදුරටත් සඳහන් කර තිබේ.

- **2025 නොවැම්බර් 30 - මහජන උපයෝගිතා සේවා නැවත ස්ථාපනය කිරීම (මාධ්‍ය නිවේදනය)**[38]
  යටිතල පහසුකම්වලට සිදුවී ඇති හානි තක්සේරු කර, ආහාර හා අත්‍යවශ්‍ය සේවා අඩුපාඩු හඳුනා ගන්නා ලෙසත්, වහාම ඒ සඳහා පිළියම් යොදා ඒ පිළිබඳ ප්‍රගතිය වාර්තා කරන ලෙසත් අත්‍යාවශ්‍ය සේවා කොමසාරිස් ජෙනරාල්වරයා පළාත් ප්‍රධාන ලේකම්වරුන්ට නියෝග කළේ ය. පළාත් පාලන ආයතනවලට අයත් උපකරණ සහ කාර්ය මණ්ඩල මාරු කර ගැනීමට ද බලය ලබා දෙන ලදී. බෙදාහැරීමේ අවහිරතා විසඳීමට සහ ක්‍රියාකාරී සැලසුම් ඉදිරිපත් කිරීමට දිස්ත්‍රික් ලේකම්වරුන්ට උපදෙස් දෙන ලදී. සැපයුම් දාම අවහිරතා විසඳීම පිණිස එල්.පී. ගෑස් මෙට්‍රික් ටොන් 3,955 ක් නෞකාවක් හම්බන්තොට වරායට ගොඩබෑමට අවසර දෙන ලද අතර, ආහාර තොග බෙදා හැරීම සඳහා හලාවත ලංකා සතොස ගබඩාව විවෘත කර තැබීමට පුත්තලම දිස්ත්‍රික් ලේකම්වරයාට අවසර දෙන ලදී.

- **2025 දෙසැම්බර් 01 - අධික මිල ගණන් අයකිරීම වැළැක්වීම (මාධ්‍ය නිවේදනය, ගොනු අංකය 2025/02)**[39]
  ආපදා හේතුවෙන් ඇතිවන හිගයන් උපයෝගී කරගනිමින් ඇතැම් වෙළඳුන් අධික මිල ගණන් යටතේ පාරිභෝගිකයන්ට භාණ්ඩ අලෙවි කිරීමට උත්සාහ කරන බවට අත්‍යාවශ්‍ය සේවා කොමසාරිස් ජෙනරාල්වරයා  අනතුරු ඇඟවූයේ ය. අත්‍යවශ්‍ය සේවා සහ පාරිභෝගික ආරක්ෂණ නීති යටතේ එවැනි පිළිවෙත් නීති විරෝධී ලෙස ප්‍රකාශයට පත් කරන ලදී. අසාධාරණ මිලගණන් අයකිරීම, භාණ්ඩ රැස්කර තබා ගැනීම, භාණ්ඩ සඟවා තැබීම හෝ වෙනත් කූට වෙළඳ උපක්‍රම භාවිතා කිරීම වැනි ක්‍රියාවන්හි නියැළී සිටින පුද්ගලයන්ට හෝ ව්‍යාපාරවලට එරෙහිව නීතිමය පියවර ගන්නා බවට දැනුම් දීමක් ද සිදුකරන ලදී. අඛණ්ඩ සැපයුමක් පවත්වා ගැනීමට, උපරිම සිල්ලර මිලට (මිල ලකුණු කර ඇති අවස්ථාවල) භාණ්ඩ විකිණීමට සහ අනෙකුත් සියලු ම ද්‍රව්‍ය සඳහා සාධාරණ මිලක් නියම කරන බව සහතික කරන ලෙසට වෙළඳුන්ට උපදෙස් දෙන ලදී..

- **2025 දෙසැම්බර් 01 - ආපදා සහන සහ ප්‍රතිසංස්කරණ වැඩසටහන් (පුවත්පත් නිවේදනය, ගොනු අංක 2025/03)**[40]
  ආපදාව හේතුවෙන් සිදුවූ මරණ සහ අතුරුදහන්වීම් ලියාපදිංචි කිරීමට හැකි වනු පිණිස රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් 2010 අංක 19 දරන මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) පනතේ 9 වෙනි වගන්තිය යටතේ අපදාවෙන් බලපෑමට ලක් වූ ප්‍රදේශ "ජාතික ආපදා ප්‍රදේශ" ලෙස ගැසට් මගින් ප්‍රකාශයට පත්කරනු ඇති බව අත්‍යාවශ්‍ය සේවා කොමසාරිස් ජෙනරාල්වරයා නිවේදනය කළේ ය. එවැනි මරණ ලියාපදිංචි කිරීමේ බලය දිස්ත්‍රික් ලේකම්වරුන්ට සහ ප්‍රාදේශීය ලේකම්වරුන්ට පවරන ලදී. මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ග 108 ක් ප්‍රතිසංස්කරණය කිරීමට ඇති බව වාර්තා වූ අතර, අඛණ්ඩ ගෑස් සැපයුමක් සහතික කිරීම සඳහා ලිට්‍රෝ ගෑස් සමාගම සමග සාකච්ඡා පවත්වන ලදී. හිගයන් පවතින අත්‍යාවශ්‍ය භාණ්ඩ ලැයිස්තු ප්‍රකාශයට පත් කරන ලෙසටත්, පරිත්‍යාගශීලීන් සමග සම්බන්ධීකරණය කිරීම සඳහා මධ්‍ය කාලීන අවශ්‍යතා අග්‍රාමාත්‍ය කාර්යාලයට යොමු කරන ලෙසටත් දිස්ත්‍රික් ලේකම්වරුන්ට උපදෙස් දෙන ලදී. රේගු සහ බදු සහන ලබා දීම සඳහා විදේශීය රටවලින් ලැබෙන පරිත්‍යාග ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය යටතේ භාරගැනීමට සැලසුම් කරන ලදී. එමෙන්ම, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රමිතීන්ට අනුකූල වන ශීත කළ එළවළු ආනයනය කිරීමට ද රජය තීරණය කළේ ය.

- **2025 දෙසැම්බර් 02 - උපයෝගිතා, මාර්ග, ජලය සහ සන්නිවේදන යාවත්කාලීන කිරීම් (මාධ්‍ය නිවේදනය, ගොනු අංකය 2025/04)**[41]

---

38 https://ocges.gov.lk/pdf/2025-01-E.pdf
39 https://ocges.gov.lk/pdf/2025-02-E.pdf
40 https://ocges.gov.lk/pdf/2025-03-E.pdf
41 https://ocges.gov.lk/pdf/2025-04-E.pdf

මාර්ග අවහිරවීම් හේතුවෙන් ඇතැම් ප්‍රදේශවල ප්‍රමාදයන් පැවතුණ ද, ජාතික සැපයුම අඛණ්ඩව පවත්වාගෙන යන බවත්, දෛනික බෙදාහැරීම සිලින්ඩර 75,000 සිට 91,000 දක්වා වැඩි කර ඇති බවත් ලිට්‍රෝ ගෑස් සමාගම තහවුරු කළේ ය. බදුල්ල සහ මහනුවර දිස්ත්‍රික්කවල ජල සම්පාදන යෝජනා ක්‍රම පහක් ප්‍රතිසංස්කරණය කිරීම ආරම්භ කර ඇත. රට පුරා තිබෙන ගෘහස්ථ ජල සම්බන්ධතා මිලියන 2.95 න් 388,000 ක් පමණ තවමත් බිඳවැටී පවතියි. දුරකථන සේවා වලින් ආසන්න වශයෙන් සියයට 20 ක් බලපෑමට ලක්ව ඇති අතර, ඒවා නැවත ස්ථාපනය කිරීමට හැකි වන්නේ විදුලි සැපයුම යථා තත්ත්වයට පත්කිරීමෙන් පසුව ය. මෙදින වන විට, සීමා කර තිබූ මාර්ග 256 න් 231 ක් නැවත විවෘත කර තිබුණි. ප්‍රවේශ විය නොහැකි ප්‍රදේශවලට ආහාර සහ ජලය සපයා දීම සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාව සතු සම්පත් යොදා ගෙන තිබුණි.

- **2025 දෙසැම්බර් 03 - පරිත්‍යාගශීලීන්ගේ සම්බන්ධීකරණය කිරීම සහ දත්ත පද්ධති (මාධ්‍ය නිවේදනය, ගොනු අංකය 2025/05)[42]**
  බලපෑමට ලක් වූ පුද්ගලයන් සහ ඔවුන්ගේ නිශ්චිත අවශ්‍යතා පිළිබඳ නිවැරදි තොරතුරු ඇතුළත් කරමින් දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල ඒවායෙහි දත්ත පද්ධති යාවත්කාලීන කර ඇති බව අත්‍යාවශ්‍ය සේවා කොමසාරිස් ජෙනරාල්වරයා පරිත්‍යාගශීලීන්ට දැනුම් දුන්නේ ය. කිසිදු පුද්ගලයෙකු හෝ ප්‍රදේශයක් අත්නොහැරෙන පරිදි, ඉලක්කගත, සමබර සහ ක්‍රමානුකූල ආකාරයකට සහාය සපයා දෙනු පිණිස එම ලේකම්කාර්යාල හරහා ආධාර සම්බන්ධීකරණය කරන ලෙස පරිත්‍යාගශීලීන්ගෙන් ඉල්ලා සිටින ලදී.

- **2025 දෙසැම්බර් 03 - දිත්වා සුළි කුණාටුවෙන් ඇතිවූ බලපෑම තක්සේරු කිරීම සහ යථා තත්ත්වයට පත්කිරීමේ වැඩසටහන් (මාධ්‍ය නිවේදනය, ගොනු අංකය 2025/06)[43]**

  නියමිත සායනවලට සහභාගීවීම, ප්‍රතිකාර ලබාගැනීම හෝ වෛද්‍ය පරීක්ෂණ මග හැරුණු රෝගීන්ට ආපදා කාලයෙන් පසු අලුතින් දින ලබා දෙන ලෙස සහ ප්‍රතිකාර කිරීමේ දී ඔවුන්ට ප්‍රමුඛත්වය දෙන ලෙසට උපදෙස් දෙන ලදී. කෘෂිකර්මාන්ත, වාරිමාර්ග, මාර්ග, පාලම්, දුම්රිය මාර්ග, විදුලිය සහ විදුලි සංදේශ යන අංශවල විශාල හානි සිදුවී ඇති බවට වාර්තා විය. කිලෝමීටර 1,593 ක දුම්රිය මාර්ග පද්ධතියෙන්, ධාවනයට සුදුසු තත්ත්වයේ පැවතියේ කිලෝමීටර 478 ක් පමණි. හානියට පත් දුරකථන සම්බන්ධතාවලින් සියයට 91 ක් පමණ සහ බලපෑමට ලක් වූ පාරිභෝගිකයන්ගේ විදුලි සම්බන්ධතා වලින් සියයට 72 ක් පමණ යථා තත්ත්වයට පත් කර ඇත. ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය ව්‍යුහාත්මක තක්සේරු කිරීම් සිදු කළ අතර, දේශගුණ ප්‍රතිචාරී ප්‍රතිප්‍රාප්ති සහ ප්‍රතිසංස්කරණ ආයෝජන සැලැස්මක් සකස් කරන ලෙස ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවට උපදෙස් දෙන ලදී.

- **2025 දෙසැම්බර් 06 - ජාතික අත්‍යවශ්‍ය සේවා ක්ෂණික ඇමතුම් අංකය (මාධ්‍ය නිවේදනය, ගොනු අංකය 2025/02)[44]**
  විදුලිය, ඉන්ධන, රෝහල් සහ හදිසි වෛද්‍ය සේවා, පොදු ප්‍රවාහනය සහ සැපයුම්, ජලය සහ සනීපාරක්ෂක සේවා, ආහාර සහ අත්‍යවශ්‍ය භාණ්ඩ, විදුලි සංදේශ සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා, වාරිමාර්ග සහ ගැසට් පත්‍ර මගින් ප්‍රාකාශයට පත්කර ඇති අනෙකුත් අත්‍යවශ්‍ය සේවා සම්බන්ධ දුෂ්කරතා පිළිබඳ පැමිණිලි කිරීම සඳහා ම වෙන් වූ 1904 ක්ෂණික ඇමතුම් අංකය දියත් කරන ලදී. අත්‍යාවශ්‍ය සේවා කොමසාරිස් ජෙනරාල්වරයාගේ මෙහෙයුම් මධ්‍යස්ථානය එම ඇමතුම් ලබාගෙන, ඒවා තහවුරු කරගෙන, ප්‍රමුඛත්වය ලබාදී, අදාළ අංශවල ප්‍රතිචාර කණ්ඩායම් වෙත යොමු කරයි.

- **2025 දෙසැම්බර් 09 - යටිතල පහසුකම්, ප්‍රමාණවත් ජල සැපයුම, ජාත්‍යන්තර සම්බන්ධීකරණය සහ කාර්ය සම්පාදනය (මාධ්‍ය නිවේදනය, රාත්‍රී 09.30, ගොනු අංකය 2025/08)[45]**

---

[42] https://ocges.gov.lk/pdf/2025-05-E.pdf
[43] https://ocges.gov.lk/pdf/2025-06-E.pdf
[44] https://ocges.gov.lk/pdf/2025-07-E.pdf
[45] https://ocges.gov.lk/pdf/2025-08-E.pdf

බලපෑමට ලක් වූ බවට හඳුනාගන්නා ලද, රට පුරා පිහිටි මාර්ග කොටස් 298 න් 288 ක් ම නැවත විවෘත කර ඇත. මාර්ග, පාලම්, බෝක්කු, වැව්, අමුණු සහ ගොඩනැගිලි අලුත්වැඩියා කිරීම කඩිනම් කිරීම පිණිස 2025 දෙසැම්බර් 1 වෙනි දින සිට 2026 මාර්තු 31 වෙනි දින දක්වා කාලය තුළ ප්‍රජා පාදක සංවිධානවලට ප්‍රදානය කරනු ලබන කොන්ත්‍රාත්තුවල මූල්‍ය වටිනාකමේ උපරිම සීමාව රු.මි. 2.0 සිට රු.මි. 5.0 දක්වා වැඩි කරන ලෙස ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවට දැනුම් දෙන ලදී. ප්‍රජා ජල යෝජනා ක්‍රම ප්‍රතිසංස්කරණය කිරීම සඳහා අවශ්‍ය රොන් මඩ පොම්පකිරීමේ යන්ත්‍ර හදිසි ප්‍රසම්පාදන යටතේ මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබා දෙන ලද අතර, 2025 වර්ෂය තුළ නිම කිරීමට නොහැකි වන ජල ව්‍යාපෘති ස්ථිර ලෙස ප්‍රතිසංස්කරණය කිරීම සඳහා 2026 වර්ෂය සඳහා වෙන්කර ඇති ප්‍රතිපාදන වලින් අරමුදල් වෙන් කරන ලෙස මුදල් කොමිෂන් සභාවට උපදෙස් දෙන ලදී. අඛණ්ඩ ජල සැපයුමක් සහතික කිරීම පිණිස, හමුදාව සහ පළාත් සභා සතු ජල බවුසර් සහ පෞද්ගලික ජල බව්සර් යොදවා ඇත. කඩිනම් තක්සේරු කිරීම් සිදුකිරීම, සැපයුම් සහාය සහ අවතැන්වීම් නිරීක්ෂණය කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන, ව්‍යාපෘති සේවා සඳහා වන එක්සත් ජාතීන්ගේ කාර්යාලය සහ සංක්‍රමණය පිළිබඳ ජාත්‍යන්තර සංවිධානය ඇතුළු ජාත්‍යන්තර හවුල්කරුවන් සම්බන්ධ කර ගන්නා ලද අතර, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව පශ්චාත්-ආපදා අවශ්‍යතා තක්සේරුව ආරම්භ කළේ ය. දේශීය හා විදේශීය වශයෙන් ලැබෙන පරිත්‍යාග ගබඩා කිරීම සඳහා අමතර ගබඩා වෙන් කරන ලදී. 2025 දෙසැම්බර් මස 9 වෙනි දින මධ්‍යාහ්නය වන විට, 1904 ක්ෂණික ඇමතුම් අංකයට පැමිණිලි 1,340 ක් ලැබී ඇති අතර, ජාතික සන්නිවේදන ජාලයෙන් ආසන්න වශයෙන් සියයට 99 ක් යථා තත්ත්වයට පත් කර ඇත.

## 6. සහන

### (අ). කඩිනම් ආපදා සහන

2025 නොවැම්බර් 28 වෙනි දින රජය කඩිනම් ආපදා සහන සංවිධානය කිරීම, සම්බන්ධීකරණය කිරීම සහ ක්‍රියාත්මක කිරීම පාලනය කෙරෙන ප්‍රධාන පරිපාලන මෙවලම සංස්ථාපනය කරන සංශෝධනයක්[46] ද සමගින් **අංක 01/2025 දරන ආපදා සහන සේවා චක්‍රලේඛය[47]** නිකුත් කළේ ය. මෙම චක්‍රලේඛය මගින් සියලු ම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් සභා, පළාත් පාලන ආයතන, දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ ආපදා ප්‍රතිචාර දැක්වීමේ නිරත සියලු ම රාජ්‍ය නිලධාරීන්ට අදාළ වන අනිවාර්ය මෙහෙයුම් රාමුවක් ස්ථාපනය කරයි.

මෙම චක්‍රලේඛය මගින් අදාළ දිස්ත්‍රික්කය තුළ කඩිනම් ආපදා සහන මෙහෙයුම්වල සමස්ත සම්බන්ධීකරණය සිදුකරන අධිකාරිය ලෙස දිස්ත්‍රික් ලේකම්වරයාව නම් කර ඇති අතර, දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක වන සියලු ම රේඛීය ආයතනවල ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීමේ සහ චක්‍රලේඛයේ අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම්වරුන්ට මෙහෙයුම් උපදෙස් නිකුත් කිරීමේ බලතල දිස්ත්‍රික් ලේකම්වරයාට පවරා ඇත.

මෙම චක්‍රලේඛය ක්‍රියාත්මක කිරීම සඳහා 2025 දෙසැම්බර් 6 වෙනි දින ආරක්ෂක අමාත්‍යාංශය විසින් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ සහ රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ අනුමැතිය ඇතිව **කඩිනම් ආපදා සහන මෙහෙයුම් සඳහා වන සවිස්තරාත්මක මාර්ගෝපදේශයක්[48]** නිකුත් කරන ලදී. අංක 01/2025 දරන චක්‍රලේඛය ඌනපූරණය කරන මෙම මාර්ගෝපදේශය මගින් විවිධ අංශ වල සහන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා පහත සඳහන් කරුණු ද ඇතුළත් නිශ්චිත උපදෙස් සපයා දෙයි:

- සහන සපයාදීමේ දී දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ආපදා කළමනාකරණ කමිටුවලට පැවරෙන කාර්ය භාරයන් සහ වගකීම්;

[46]https://sinhala.dgi.gov.lk/images/2025/28/Disaster_Relief_Services_circular_Amendment_01-2025.pdf
[47]http://www.ndrsc.gov.lk/web/phocadownload/disaster%20relief%20services%20circular%20012025.pdf
[48]https://civilsocietycollectiveforemergencyresponse.wordpress.com/wp-content/uploads/2025/12/disaster_relief_services_guideline_012025.pdf

- ඉඩම් හිමිකම හෝ ආදායම් මට්ටම නොසලකා අදාළ වන, එකවර ලබා දෙනු ලබන මූල්‍යාධාර බෙදා දීම ඇතුළුව හදිසි අවස්ථා දීමනා බෙදාහැරීමේ කාර්ය පටිපාටි;
- පීඩාවට පත් වූ පාසල් සිසුන්, හානියට පත් නිවාස, අහිමි වූ ජීවනෝපායන් සහ අවතැන් වූ පුද්ගලයන් පිළිබඳ මූලික තක්සේරුව සිදුකිරීම සඳහා අවශ්‍ය කාර්යයන් පැවරීම;
- මුදල් ආධාර සහ අනෙකුත් සහන බෙදා දීමේදී පැන නගින මෙහෙයුම් ගැටළු නිරීක්ෂණය කිරීම සහ ඒවා විසඳීම සඳහා අවශ්‍ය උපදෙස;
- විවිධ ප්‍රදේශ පුරා සහන මෙහෙයුම් අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම සඳහා දිස්ත්‍රික් කමිටු සහ ප්‍රාදේශීය කමිටු අතර සම්බන්ධීකරණ යාන්ත්‍රණ.

### (ආ). සහන අරමුදල් සඳහා පාර්ලිමේන්තුමය සහ අයවැයමය අවසරය

දිට්වා සුළි කුණාටුව හේතුවෙන් ඇති වූ හදිසි තත්ත්වය නිසා පාර්ලිමේන්තුවේ කථානායකවරයා **2025 දෙසැම්බර් 12 දිනැති අංක 2466/33 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය**[49] නිකුත් කරමින් හදිසි අරමුදල් අවශ්‍යතා සලකා බැලීම සඳහා පාර්ලිමේන්තුවේ විශේෂ රැස්වීමක් කැඳවූයේ ය. පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 16 අනුව එම විශේෂ රැස්වීම 2025 දෙසැම්බර් 18 වෙනි දින කැඳවන ලද අතර, පරිපූරක ඇස්තමේන්තුවක් අනුමත කිරීම සඳහා එම විවාදය 2025 දෙසැම්බර් 19 වෙනි දින දක්වා පවත්වන ලදී.

රජය මූලික වශයෙන් රු.බි. 500 ක පරිපූරක ඇස්තමේන්තුවක් සභාගත කළේ ය. රේඛීය අමාත්‍යාංශ සහ පළාත් සහ දිස්ත්‍රික් පරිපාලනයන් විසින් සිදු කරන ලද යාවත්කාලීන කළ හානි, අලාභ සහ අවශ්‍යතා තක්සේරු කිරීම් වලින් පසුව, රජය **රු. බි. 1,000 ක සංශෝධිත පරිපූරක ඇස්තමේන්තුවක්** ඉදිරිපත් කළේ ය. පාර්ලිමේන්තුව සංශෝධිත පරිපූරක ඇස්තමේන්තුව අනුමත කළ අතර, එමගින් ඒකාබද්ධ අරමුදල මගින් ගෙවනු ලැබිය හැකි අතිරේක විසර්ජන සඳහා අවසර ලබා දුන්නේය.[50]

### (ඇ) මූල්‍ය අංශයේ සහන සහ බැංකු නියෝග

දිට්වා සුළි කුණාටුවෙන් පීඩාවට පත් පුද්ගලයන්ට සහ ව්‍යාපාරවලට සහන සැලසීම සඳහා 2025 දෙසැම්බර් 05 වෙනි දින ශ්‍රී ලංකා මහ බැංකුව සියලු ම බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු වෙත **2025 අංක 04 දරන බැංකු චක්‍රලේඛය**[51] නිකුත් කළේ ය. එහි සඳහන් ප්‍රධාන නියමයන්ට පහත සඳහන් නියමයන් ඇතුළත් වේ:

- ප්‍රාග්ධනය සහ/හෝ පොලිය ආපසු ගෙවීම සඳහා මාස හයක් දක්වා වූ ණය පමා සහන කාලයක් ලබා දීම
- දඩමුදලක් හෝ අමතර පොලියක් අය නොකර ණය ප්‍රතිව්‍යුහගත කිරීම හෝ නැවත සැලසුම් කිරීම.
- ආපදා හේතුවෙන් සිදුවන ප්‍රමාදයන් මත වත්කම් වර්ගීකරණය පහත හෙළීමක් සිදු නොකිරීම.
- ප්‍රතිසංස්කරණ හෝ යථා තත්ත්වයට පත්කිරීමේ කටයුතු සඳහා නව සහනදායී ණය පහසුකම් ලබා දීම සලකා බැලීම.
- බැංකු විසින් මෙම සහන සඳහා සුදුසුකම් ලබන ණය ගැනුම්කරුවන් හඳුනා ගෙන, වාර්තා පවත්වා ගනිමින්, බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත වරින් වර වාර්තා ඉදිරිපත් කළ යුතුය.

---

[49] https://documents.gov.lk/view/extra-gazettes/2025/12/2466-33_E.pdf
[50] https://mawratanews.lk/news/speaker-convenes-special-parliament-sitting-to-approve-rs-1000-bn-supplementary-estimate-for-cyclone-relief/
[51] https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/laws/cdg/bsd_circular_no_4_of_2025_e.pdf

බලපත්‍රලාභී මූල්‍ය සමාගම්, විශේෂිත කල්බදු සමාගම් සහ අනෙකුත් බැංකු නොවන මූල්‍ය ආයතන සඳහා ද ඉහත සඳහන් කළ සහන ක්‍රියාමාර්ග අදාළ කරමින් ශ්‍රී ලංකා මහ බැංකුව 2026 ජනවාරි 9 වෙනි දින **2026 අංක 01 දරන මූල්‍ය සමාගම් සහ විශේෂිත කල්බදු සමාගම් චක්‍රලේඛය[52]** නිකුත් කළේ ය. මෙම ආයතන විසින් ද පමා සහන කාලයන්, ප්‍රතිව්‍යුහගත කිරීම, වත්කම් වර්ගීකරණය කිරීම, නව පහසුකම් ලබා දීම සහ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත වාර්තා කිරීම සම්බන්ධයෙන් ඉහත සඳහන් කළ නියමයන් අනුගමනය කළ යුතු ය.

**(ඈ). ජාතික රාජ්‍ය මූල්‍ය සහන සහ ව්‍යාපාර වන්දි**

2025 දෙසැම්බර් 05 වෙනි දින, ජාතික රාජ්‍ය මූල්‍ය අධිකාරිය ලෙස ක්‍රියා කරමින් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය දිත්වා සුළි කුණාටුවෙන් පීඩාවට පත් පුද්ගලයන්, කුටුම්භ සහ ව්‍යවසාය සඳහා රජය විසින් අරමුදල් සපයනු ලබන මූල්‍යාධාර වැඩසටහනක් ස්ථාපනය කරමින් **අංක 08/2025 දරන අයවැය චක්‍රලේඛය[53]** නිකුත් කළේ ය. අනුමත අයවැය ප්‍රතිපාදන සහ හදිසි ප්‍රතිපාදන වලින් පහත සඳහන් කාර්යයන් සඳහා වියදම් දැරීමට ගණන් දීමේ නිලධාරීන්ට සහ ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන්ට මෙම චක්‍රලේඛය මගින් බලය පවරයි:

- නිවාස පිරිසිදු කිරීම සඳහා ආධාර;
- අත්‍යවශ්‍ය ගෘහ භාණ්ඩ නැවත ලබා ගැනීම;
- තාවකාලිකව අවතැන් වූ පවුල් සඳහා යැපීම් දීමනා;
- ජීවනෝපාය නැවත ස්ථාපනය කිරීම සඳහා ප්‍රදාන; සහ
- සහභාගී වන මූල්‍ය ආයතන හරහා සහනදායී ණය යොමු කිරීම් යාන්ත්‍රණ.

ප්‍රතිලාභීන් හඳුනා ගැනීමේ, හානිය තහවුරු කර ගැනීමේ, අලාභය සහතික කිරීමේ සහ ගෙවීම් කාලසටහන් ඉදිරිපත් කිරීමේ වගකීම් දරන මූලික ක්ෂේත්‍ර මට්ටමේ ක්‍රියාත්මක කිරීමේ බලධාරීන් ලෙස ප්‍රාදේශීය ලේකම්වරුන් නම් කර ඇත.

2025 දෙසැම්බර් 20 වෙනි දින අමාත්‍යාංශය ව්‍යවසාය මට්ටමෙන් ලබා දෙන ආධාර පුළුල් කර, වර්ගීකරණය කරමින්, **අංක 08/2025(i) දරන අයවැය චක්‍රලේඛය[54]** නිකුත් කළේ ය. චක්‍රලේඛයේ පහත සඳහන් පරිදි සඳහන් කර ඇත:

- භෞතික හෝ මෙහෙයුම් අලාභයක් සිදුවී ඇති ලියාපදිංචි ක්ෂුද්‍ර හා සුළු පරිමාණ ව්‍යවසාය සඳහා රු. 200,000 දක්වා එක් වරක් පමණක් ගෙවන, ආපසු නොගෙවිය යුතු ප්‍රදානයක්.
- ලියාපදිංචි නොකළ ගෘහ පාදක ව්‍යාපාර සහ නිෂ්පාදන ඒකක සඳහා රු. 50,000 ක ප්‍රදානයක්.
- ජංගම, පදික වේදිකා සහ තාවකාලික වෙළඳුන් සඳහා රු. 25,000 ක ප්‍රදානයක්.
- සුළු ව්‍යුහාත්මක හානි සඳහා තාක්ෂණික තක්සේරුවකින් තොරව රු. 500,000 දක්වා ගොඩනැගිලි අලුත්වැඩියා කිරීමේ ආධාර.
- සැලකිය යුතු හෝ විශාල ව්‍යුහාත්මක හානියක් තාක්ෂණික තක්සේරු වාර්තාවක් මගින් තහවුරු කරන විට රු. 5,000,000 දක්වා ගොඩනැගිලි අලුත්වැඩියා කිරීමේ හෝ ප්‍රතිසංස්කරණය කිරීමේ ආධාර.

මෙම චක්‍රලේඛය මගින් ග්‍රාම නිලධාරි සහතික, ඡායාරූපමය සාක්ෂි සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමේ තහවුරු කිරීමේ කමිටුවල සහතික ඇතුළු ලේඛනමය අවශ්‍යතා නියම කරයි.

2026 ජනවාරි 22 වන දින අමාත්‍යාංශය විසින් ව්‍යවසාය සඳහා සහන ණය උපරිම සීමාවන් හඳුන්වා දෙමින් **අංක 08/2025(iii) දරන අයවැය චක්‍රලේඛය[55]** නිකුත් කළේ ය:

- ක්ෂුද්‍ර ව්‍යවසායන් සඳහා රු. 250,000;

---

[52] https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/laws/cdg/snbfi_circular_no_1_of_2026_e.pdf
[53] https://www.treasury.gov.lk/api/file/8322d7b1-c343-4a47-a4c3-27a1c7baa7ec
[54] https://www.treasury.gov.lk/api/file/a50e4973-227b-4b84-acf2-42748ac25738
[55] https://www.treasury.gov.lk/api/file/8d93c8ad-5091-4f96-b486-6972c63212dc

- කුඩා ව්‍යවසායන් සඳහා රු. 1,000,000;
- මධ්‍යම හා මහා පරිමාණ ව්‍යවසායන් සඳහා රු. 25,000,000 දක්වා.

මෙම ණය පහසුකම් සඳහා 3% ක වාර්ෂික ස්ථාවර පොලී අනුපාතයක්, මාස හයක සහන කාලයක් සහ වසර තුනක් දක්වා ආපසු ගෙවීමේ කාලයක් ලැබේ. මෙම ණය යෝජනා ක්‍රමය සඳහා සහභාගී වන බැංකුවලට රජයේ පොලී-සහනාධාර වැඩපිළිවෙළ යටතේ ණය සැකසුම් කරන ලෙසට සහ වෙනම ණය පැතිකඩ නිරීක්ෂණයන් පවත්වාගෙන යන ලෙසට උපදෙස් දෙනු ලැබේ.

### (ඉ). නිවාස හානි සහ ප්‍රතිසංස්කරණය සඳහා වන්දි

දිට්වා සුළි කුණාටුව හේතුවෙන් සිදු වූ නිවාස හානි තක්සේරු කිරීම, සහන සැලසීම සහ ප්‍රතිසංස්කරණය කිරීම සඳහා පරිපාලන රාමුවක් ස්ථාපනය කිරීම සඳහා වන සංශෝධනයක්[56] සහ මාර්ගෝපදේශ[57] සමගින් රජය **අංක 01/2025 දරන ආපදා සහන සේවා චක්‍රලේඛය[58]** නිකුත් කළේ ය. මෙම චක්‍රලේඛය මගින් ප්‍රාදේශීය ලේකම්වරුන් සහ රේඛීය ආයතන මෙහෙයවීම සඳහාත් ප්‍රතිලාභීන් සහ වියදම් වාර්තා පවත්වාගෙන යාම සඳහාත් දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත බලය පවරමින්, දිස්ත්‍රික් මට්ටමින් නිවාස හානි සහ ප්‍රතිසංස්කරණ මෙහෙයුම්වල සමස්ත සම්බන්ධීකාරකවරුන් ලෙස දිස්ත්‍රික් ලේකම්වරුන් නම් කරන ලදී.

බලපෑමට ලක් වූ නිවාස සඳහා වන මූල්‍ය රාමුව විධිමත් කරමින් මුදල් අමාත්‍යාංශය **අංක 08/2025[59]** සහ **08/2025 (i) දරන අයවැය චක්‍රලේඛ[60]** නිකුත් කළේ ය. මෙම චක්‍රලේඛ මගින් පහත සඳහන් පරිදි විධිවිධාන සලසා තිබේ:

- කඩිනම් මුදල් අත්තිකාරම්: හානියට පත් නිවාස පිරිසිදු කිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම සඳහා එක් නිවසකට රු. 25,000;
- ගෘහ/මුළුතැන්ගෙයි අත්‍යවශ්‍ය උපකරණ මිලදී ගැනීම සඳහා රු. 50,000;
- මාසික ජීවන වියදම් හෝ නිවාස කුලී ආධාර: අදාළ වන පරිදි;
- සම්පූර්ණයෙන් ම විනාශ වූ නිවාස සඳහා ප්‍රතිසංස්කරණ ප්‍රදාන: රු.5,000,000 දක්වා;
- මරණ හෝ පූර්ණ ආබාධිතභාවය සඳහා වන්දි: රු.1,000,000 දක්වා.

**2025 නොවැම්බර් 30[61] සහ දෙසැම්බර් 2[62] යන දිනවල නිකුත් කරන ලද අංක NDRSC/02/04/10** දරන ආරක්ෂක අමාත්‍යාංශ චක්‍රලේඛ මගින් දිට්වා සුළි කුණාටුවෙන් හානියට පත් නිවාස සම්පූර්ණයෙන් ප්‍රතිසංස්කරණය කිරීමට පෙර ඒවායෙහි ආරක්ෂිතව නැවත පදිංචි කරවීමට හැකි වන පරිදි එම නිවාස සඳහා මුදල් අත්තිකාරම් සහ දීමනා වහාම ලබා දීමට අවසර දුන්නේ ය. මෙම චක්‍රලේඛ අංක 2465/08 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය[63] යටතේ ප්‍රකාශයට පත් කරන ලද ජාතික ආපදා ප්‍රදේශවල පිහිටි සියලු ම නිවාස සඳහා අදාළ වේ.

---

[56] https://ocges.gov.lk/pdf/2025-08-E.pdf,

[57] https://civilsocietycollectiveforemergencyresponse.wordpress.com/wp-content/uploads/2025/12/disaster_relief_services_guideline_012025.pdf

[58] https://ocges.gov.lk/pdf/2025-07-E.pdf

[59] https://www.treasury.gov.lk/api/file/8322d7b1-c343-4a47-a4c3-27a1c7baa7ec

[60] https://www.treasury.gov.lk/api/file/a50e4973-227b-4b84-acf2-42748ac25738

[61] https://civilsocietycollectiveforemergencyresponse.wordpress.com/wp-content/uploads/2025/12/e0b6bbe0b794.10000.00e0b69a-e0b685e0b6ade0b78ae0b6ade0b792e0b69ae0b78fe0b6bbe0b6b8e0b69ae0b78a-e0b6bde0b6b6e0b78fe0b6afe0b793e0b6b8.pdf

[62] https://civilsocietycollectiveforemergencyresponse.wordpress.com/wp-content/uploads/2025/12/e0b686e0b6b4e0b6afe0b78f-e0b783e0b784e0b6b1-e0b6bde0b6b6e0b78f-e0b69ce0b790e0b6b1e0b793e0b6b8-1.pdf

[63] https://documents.gov.lk/view/extra-gazettes/2025/12/2465-08_E.pdf

**2026 ජනවාරි 6** වෙනි දින ආරක්ෂක අමාත්‍යාංශය ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය සමග සම්බන්ධීකරණය වෙමින් නිවාස සඳහා වන්දි ගෙවීම පිළිබඳ මාර්ගෝපදේශ ඇතුළත් **අංක NDRSC/02/04/10 දරන චක්‍රලේඛය**[64] නිකුත් කළේ ය. මෙම මාර්ගෝපදේශ මගින් ව්‍යුහාත්මක සම්පූර්ණත්වය පදනම් කරගෙන නිවාස හානි වර්ගීකරණය කරයි:

- සියයට 65 ඉක්මවන ව්‍යුහාත්මක හානියක් හෝ ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය විසින් අනාරක්ෂිත යැයි සහතික කර ඇති නිවාස රුපියල් 5,000,000 දක්වා ප්‍රතිසංස්කරණ ප්‍රදාන ලැබීමට සුදුසුකම් ලබයි.
- අර්ධ වශයෙන් හානි වූ නිවාසවලට බරපතලකම අනුව ශ්‍රේණිගත කරන ලද වන්දි පරාසය අනුව වන්දි හිමි වේ.
- තමන්ගේ ම ඉඩමක නැවත නිවාස ඉදිකරන ප්‍රතිලාභීන්ට ඉදිකිරීම් ප්‍රගතිය තහවුරු කර ගැනීමට මත පදනම්ව අදියරෙන් අදියර මුදල් ලැබේ.
- ඉඩම් හිමිකම නොමැති ප්‍රතිලාභීන්ට සුදුසුකම් මත සහ ලබා ගැනීමට තිබේද යන්න පදනම් කරගෙන රජයේ ඉඩම් වෙන් කරදීමට හෝ රජය විසින් ඉදිකරන ලද නිවාස ඒකක ලබා දීමට සලකා බැලිය හැකිය.

ප්‍රතිලාභීන්ගේ ලැයිස්තු සකස් කර පවත්වාගෙන යාම, ප්‍රතිසංස්කරණවල ප්‍රගතිය අධීක්ෂණය කිරීම සහ ගෙවීම් ලැබීම සඳහා සුදුසුකම සහතික කිරීම ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ වගකීම වේ.

### (ඊ). කෘෂිකර්ම, පශු සම්පත් සහ ධීවර අංශ සඳහා සහන

දිට්වා සුළි කුණාටුව හේතුවෙන් බලපෑමට ලක් වූ කෘෂිකර්මාන්ත, පශු සම්පත් සහ ධීවර අංශ සඳහා සහන සහ වන්දි ලබා දීම මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද **2025 දෙසැම්බර් 5 දිනැති අංක 08/2025 දරන අයවැය චක්‍රලේඛය මගින් ස්ථාපනය කරන ලද ජාතික රාජ්‍ය මූල්‍ය සහන රාමුව**[65] සහ ඉන් පසුව නිකුත් කරන ලද **2025 දෙසැම්බර් 20 දිනැති අංක 08/2025(i)**[66] සහ **2026 ජනවාරි 22 දිනැති අංක 08/2025(iii)**[67] දරන චක්‍රලේඛ යටතේ ක්‍රියාත්මක කරනු ලැබේ.

#### 1) පශු සම්පත් අංශය සඳහා වන්දි ගෙවීම

පශු සම්පත් අංශයේ සිදුවී ඇති පාඩු හෝ හානි සඳහා ලබා දෙන වන්දි ප්‍රදාන ආධාර ලෙස සපයා දෙනු ලැබේ. දිට්වා සුළි කුණාටුවෙහි ප්‍රතිඵලයක් ලෙස සතුන්ට, සතුන් තබා ගන්නා ආවරණවලට, සහ භාවිතා කරන උපකරණවලට හෝ නිෂ්පාදන ධාරිතාවයට අලාභයක් හෝ හානියක් සිදුවී ඇති, ලියාපදිංචි ගොවිපළ සහ පශු සම්පත් හිමියන් සුදුසුකම් ලත් ප්‍රතිලාභීන්ට අයත් වේ. එක් එක් අංශ සඳහා නිකුත්කර ඇති උපදෙස් යටතේ දක්වා ඇති වන්දි සීමාවන් පහත සඳහන් පරිදි වේ:

- දෙමුහුන් ගවයන්: එක් ගොවිපළක් සඳහා උපරිමයකට යටත්ව **එක් සතෙකුට රු. 200,000** දක්වා;
- දේශීය ගවයන් සඳහා: එක් ගොවිපළක් සඳහා උපරිමයකට යටත්ව **එක් සතෙකුට රු. 50,000** දක්වා;
- ඌරන්: **එක් සතෙකුට රු. 20,000** දක්වා;
- එළුවන් සහ බැටළුවන්: **එක් සතෙකුට රු. 20,000** දක්වා;
- කුකුළු ගොවිපළ: ලේයර් සහ බ්‍රොයිලර් සතුන් සඳහා වෙන් වෙන් වූ මුදල් ප්‍රමාණ;
- පිටුපස මිදුලේ ඇති කුකුළු කොටු ඒකක: ඒකක සංඛ්‍යාව අනුව ස්ථාරව ප්‍රදානයක්.

සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් ග්‍රාම නිලධාරීන් සහ ප්‍රාදේශීය ලේකම්වරුන් සමග සම්බන්ධීකරණයෙන් යුතුව ක්ෂේත්‍ර පරීක්ෂණ හරහා ආධාර ලැබීමේ සුදුසුකම් සහ අලාභයේ ප්‍රමාණය තහවුරු කර ගනු ලැබේ. මෙම ප්‍රදාන මගින් අහිමි වූ සතුන්ගේ වටිනාකම

[64] https://www.adaderana.lk/news.php?nid=116936
[65] https://www.treasury.gov.lk/api/file/8322d7b1-c343-4a47-a4c3-27a1c7baa7ec
[66] https://www.treasury.gov.lk/api/file/a50e4973-227b-4b84-acf2-42748ac25738
[67] https://www.treasury.gov.lk/api/file/8d93c8ad-5091-4f96-b486-6972c63212dc

සඳහා වන්දි ලබා දෙන අතර, පශු වෛද්‍ය ප්‍රතිකාර, ආහාර ප්‍රතිස්ථාපනය සහ සුළු ව්‍යුහාත්මක අලුත්වැඩියාවන් සඳහා සීමිත සහාය සපයාදීම ද මෙයට ඇතුළත් විය හැකි ය.

### 2) වගා හානි සඳහා වන්දි ගෙවීම

දිට්වා සුළි කුණාටුව හේතුවෙන් විනාශ වූ, ජලයෙන් යට වූ හෝ ඵලදායීත්වය නැතිවී ගිය භෝග සඳහා එක් වරක් පමණක් ගෙවනු ලබන භෝග හානි ප්‍රදානයක් ලබා දෙනු ලැබේ. ක්‍රියාත්මක කිරීමේ ආයතන විසින් පහත සඳහන් පරිදි ප්‍රදාන අනුපාත අදාළ කර ගනු ලැබිය හැකි ය:

- වී සහ ප්‍රධාන ක්ෂේත්‍ර භෝග: හෙක්ටයාරයකට ප්‍රදානයක්;
- එළවළු සහ ඉහළ වටිනාකමක් ඇති වාර්ෂික භෝග: හෙක්ටයාරයකට ඉහළ වටිනාකමක් සහිත ප්‍රදානයක්;
- බහු වාර්ෂික භෝග සහ සුළු අපනයන භෝග: භෝග වර්ගය, වයස, වර්ධන අවධිය සහ තහවුරු වූ අලාභයේ ප්‍රතිශතය අනුව තීරණය කරනු ලබන ප්‍රදානයක්.

ගොවිජන සේවා මධ්‍යස්ථාන, ග්‍රාම නිලධාරීන් සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර නිලධාරීන් හෝ වෙනත් අදාළ තාක්ෂණික ආයතන විසින් භෝග හානිය තහවුරු කරගනු ලබයි. භාණ්ඩාගාරයෙන් ප්‍රතිපාදන නිදහස් කර ගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් ප්‍රතිලාභීන්ගේ ලැයිස්තු සකස් කර, සහතික කළ ගෙවීම් සැලසුම් දිස්ත්‍රික් පරිපාලන අංශ හරහා යොමු කරනු ලැබේ.

### 3) ධීවර හා ජලජ ජීවනෝපාය සඳහා වන්දි

සාගර, වෙරළබඩ, අභ්‍යන්තර ධීවර හා ජලජීවී වගා අංශවලට සිදුවී ඇති පාඩු සඳහා වන්දි ලබා දෙනු ලැබේ. සහන ක්‍රියාමාර්ගවලට පහත සඳහන් ඒවා ඇතුළත් වේ:

- පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් හානි වූ ලියාපදිංචි ධීවර යාත්‍රා සඳහා ප්‍රදාන ආධාර;
- දැල් සහ අදාළ උපකරණ ඇතුළුව හානියට පත් ධීවර ආම්පන්න සඳහා ප්‍රදාන ආධාර;
- මත්ස්‍ය පොකුණු, අභිජනනාගාර සහ ජලජීවී වගා පහසුකම් ප්‍රතිස්ථාපනය කිරීම සඳහා ධීවර ආම්පන්න, මත්ස්‍ය පැටවුන් සහ තාක්ෂණික සහාය සපයා දීම.

ධීවර පරීක්ෂකවරුන්, ධීවර සමුපකාර සමිති සහ ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් හානි තහවුරු කර ගනු ලැබේ. සහතික කරන ලද ප්‍රතිලාභීන් ලැයිස්තු ගෙවීම් සිදු කිරීම සඳහා දිස්ත්‍රික් පරිපාලන අංශ හරහා ඉදිරිපත් කරනු ලැබේ.

### 4) වගා රක්ෂණ වන්දි

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය විසින් කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ පනත යටතේ රක්ෂණය කර ඇති භෝග සඳහා රක්ෂණ හිමිකම්පෑම් ක්‍රියාවලි ගත කරයි.

රක්ෂණය කර ඇති භෝග හිමි ගොවීන්ට නියමිත වාර්තාකරණ කාල සීමාවන් තුළ ගොවිජන සේවා මධ්‍යස්ථාන හෝ කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ ප්‍රාදේශීය කාර්යාල හරහා හිමිකම්පෑම් ඉදිරිපත් කළ හැකි ය. භෝග වර්ගය, වගා අවධිය සහ සත්‍යාපනය කරගන්නා ලද හානියේ ප්‍රමාණය මත පදනම්ව හිමිකම්පෑම් තක්සේරු කරනු ලැබේ. පවතින රක්ෂණ ඔප්පුවේ කොන්දේසිවලට සහ ක්‍රියා පටිපාටිවලට අනුකූලව ගෙවීම් සිදු කරනු ලැබේ.

### 5) ලියාපදිංචි නොමැති ගොවීන් සහ කුඩා වතු හිමියන් සඳහා සහාය

ලියාපදිංචි නොවූ ගොවීන් සහ කුඩා පරිමාණ නිෂ්පාදකයින් සඳහා මානුෂීය ආධාර සපයා දෙනු ලැබේ. ක්ෂේත්‍රයේ දී තහවුරු කර ගන්නා තොරතුරු, පරිපාලන වාර්තා, සමුපකාර සමිති ලැයිස්තු හෝ ප්‍රාදේශීය වශයෙන් ලබා ගත හැකි වෙනත් දත්ත මූලාශ්‍ර පදනම් කර ගෙන ප්‍රාදේශීය

ලේකම්වරුන් විසින් සුදුසුකම් තීරණය කරනු ලැබේ. බීජ, රෝපණ ද්‍රව්‍ය, මෙවලම් සහ මූලික යෙදවුම් සඳහා කුඩා ප්‍රමාණයේ ප්‍රදාන සපයා දීම සහ තාක්ෂණික ව්‍යාප්ති සේවා වෙත ප්‍රවේශය ලබා දීම මෙම ආධාරවලට ඇතුළත් විය හැකි ය.

### (උ). රාජ්‍ය පරිපාලනය අඛණ්ඩව පවත්වාගැනීම

සුළි කුණාටුව දිවයින හරහා හමා යෑමන් යටිතල පහසුකම් පුළුල් ලෙස හානියට පත්වීමෙන් පසුව, කාර්ය පටිපාටිමය හෝ මූල්‍ය ප්‍රමාදයකින් තොරව බේරා ගැනීමේ සහ සහන මෙහෙයුම් කඩිනම් කරන ලෙස ජනාධිපතිවරයා **2025 නොවැම්බර් 28** වන දින දිස්ත්‍රික් ලේකම්වරුන්ට සහ දිස්ත්‍රික් සංවර්ධන කමිටු සභාපතිවරුන්ට උපදෙස් ලබා දුන් අතර, පවතින කාර්ය පටිපාටිවලින් පැන නගින පරිපාලන අවහිරතා මගහරවා ගැනීම සඳහා චක්‍රලේඛයක් නිකුත් කරන ලෙස රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම්වරයාට ද උපදෙස් දුන්නේ ය; මෙම නියෝගය මගින් ප්‍රාදේශීය පරිපාලකයන්ට කඩිනම් ප්‍රතිචාර දැක්වීම සඳහා වහාම පවතින අරමුදල් සහ පිරිස් භාවිතා කිරීමට බලය පවරන ලදී.[68]

එම නියෝගය අනුව කටයුතු කරමින්, ප්‍රවාහන සේවා බිඳවැටීම්, මාර්ග අවහිරතා සහ ගංවතුර, පස් කඳු කඩා වැටීම් සහ ඒ ආශ්‍රිත තත්ත්වයන් හේතුවෙන් ඇති වූ අවතැන්වීම් ඇතුළු සුළි කුණාටුවේ බලපෑම් හේතුවෙන් රාජකාරියට වාර්තා කිරීමට නොහැකි වූ රාජ්‍ය නිලධාරීන්ට **විශේෂ නිවාඩු** ලබා දීමට විධිවිධාන සලසමින් රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය **2025 දෙසැම්බර් 15 දිනැති අංක 32/2025 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය[69]** නිකුත් කළ අතර, තමන්ගේ පාලනයෙන් ඔබ්බෙහි වූ තත්ත්වයන් නිසා නිලධාරීන්ට සේවයට පැමිණීමට නොහැකි වූ කාල සීමාවන් සඳහා එය අදාළ කර ගත යුතු බවත්, එම නිවාඩු ලබා ගැනීම සඳහා ග්‍රාම නිලධාරී සහ ප්‍රාදේශීය ලේකම් විසින් සහතික කරන ලද නිවාඩු අයදුම්පතක් ඉදිරිපත් කළ යුතු බවත් එම චක්‍රලේඛය මගින් නියම කර ඇත. මෙම විශේෂ නිවාඩු පිළිබඳ විස්තර ආයතනයවල ඇති නිවාඩු ලේඛනවල සටහන් කළ යුතු අතර, මෙම විධිවිධානය විශේෂයෙන් ම 2025 නොවැම්බර් සහ දෙසැම්බර් මාසවල බලපෑ ආපදා කාලයට අදාළ වේ.

පැවති හදිසි තත්ත්වයන් මධ්‍යයෙහි අත්‍යාවශ්‍ය කාර්යයන් ඉටුකිරීම නොකඩවා පවත්වාගෙන යාම සඳහා රාජ්‍ය නිලධාරීන් ඉටුකළ අඛණ්ඩ සේවය පිළිගැනීමට සහ ප්‍රශංසාවට ලක් කිරීම සඳහා අමාත්‍යාංශය විසින් **2025 දෙසැම්බර් 30 දිනැති අංක 34/2025 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය[70]** ද නිකුත් කළ අතර, එමගින් දිට්වා සුළි කුණාටුවෙන් පසුව අඛණ්ඩ සේවා සැපයීමක් සහතික කිරීම සඳහා සහ සාමාන්‍ය රජයේ මෙහෙයුම් යථා තත්ත්වයට පත් කිරීම සඳහා රාජ්‍ය සේවකයින් ඉටු කළ සුවිශේෂී ප්‍රයත්නයන් අගය කිරීමට ලක් කරයි. මෙම චක්‍රලේඛය මගින් රජයේ නිලධාරීන් මුහුණ දෙන ද්විත්ව අභියෝග ඉස්මතු කර පෙන්වයි: පුළුල් ආපදා බලපෑමක සන්දර්භය තුළ, නැවත ගොඩනැගීමේ කටයුතු සිදුකරන අතර ම, බිඳවැටුණු ජන ජීවිතය සහ යටිතල පහසුකම් සේවා යථා තත්ත්වයට පත් කිරීම සහ ඒ සමගම 2026 වර්ෂය වෙත සිදුවන සංක්‍රාන්තිය තුළ තිරසාර කාර්ය සාධනයක් පවත්වාගැනීමේ පරිපාලන අපේක්ෂාවන් ඉටුවන බව සහතික කිරීම එම අභියෝග වේ.

මෙම විශේෂිත චක්‍රලේඛවලට අමතරව, අතිශය වැදගත් වන රජයේ කාර්යයන් සහ සේවා සැපයීම අඛණ්ඩව ඉටුකිරීම සහතික කිරීම සඳහා, ජනාධිපතිවරයා සතු බලතල යටතේ රජය **දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ ඒවායේ ක්ෂේත්‍ර නිලධාරීන්** ඇතුළු සේවාවන් රැසක් **අත්‍යාවශ්‍ය සේවාවන්** ලෙස නම් කරමින් **2025 නොවැම්බර් 29[71]** වන දින ප්‍රථම වරටත්, එය තවදුරටත් පුළුල් කරමින් 2025 දෙසැම්බර්[72] මාසයේදී ත් අති විශේෂ ගැසට් නිවේදන නිකුත් කළේ

---

[68] https://www.newswire.lk/2025/11/28/president-issues-new-circular-to-speed-up-disaster-relief-removes-financial-barriers/
[69] https://pubad.gov.lk/web/images/circulars/2025/E/1765796549-32-2025-e.pdf
[70] https://pubad.gov.lk/web/images/circulars/2025/E/1767080546-34-2025-e.pdf
[71] https://documents.gov.lk/view/extra-gazettes/2025/11/2464-29_E.pdf
[72] https://documents.gov.lk/view/extra-gazettes/2025/12/2468-46_E.pdf

ය. මෙම අත්‍යාවශ්‍ය සේවා නම් කිරීම මගින් ආපදා කාලය තුළ රාජ්‍ය පරිපාලනයේ අඛණ්ඩතාවය පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය අනෙකුත් වැදගත් අංශ වන විදුලිය, ජල සැපයුම, ආහාර සේවා, ප්‍රවාහනය, සෞඛ්‍ය සේවා, විදුලි සංදේශ සේවා සහ අනෙකුත් වැදගත් වන සේවා ආවරණය කරයි.

**(උ). රාජ්‍ය නොවන සංවිධාන/ විදේශීය හවුල්කරුවන් සම්බන්ධීකරණය කිරීම සහ මෙහෙයුම්**

ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය "අයහපත් කාලගුණ තත්ත්වය හේතුවෙන් පීඩාවට පත් ජනතාවට සහන සැලසීම සඳහා රාජ්‍ය නොවන සංවිධාන සම්බන්ධීකරණය කිරීම" නැමති මාතෘකාව යටතේ **2025 නොවැම්බර් 29 දිනැති අංක MRDSS&CE/5/3/1/361 දරන චක්‍රලේඛය**[73] නිකුත් කළේ ය. බලපෑමට ලක්වූ සෑම දිස්ත්‍රික්කයක ම ආහාර, ජලය, සනීපාරක්ෂක පහසුකම්, නවාතැන් සහ ජීවනෝපාය සහාය සැපයීම ඇතුළු සියලු ම රාජ්‍ය නොවන සංවිධාන සහන කටයුතු දිස්ත්‍රික් රාජ්‍ය නොවන සංවිධාන සම්බන්ධීකාරක සහ දිස්ත්‍රික් රාජ්‍ය නොවන සංවිධාන සම්බන්ධීකරණ කමිටුව හරහා සම්බන්ධීකරණය කළ යුතු බව එම චක්‍රලේඛය මගින් නියම කර තිබේ. මෙම මැදිහත්වීම් කාලෝචිත, මනාව සංවිධානය කරන ලද, සැබෑ අවශ්‍යතාවලට ප්‍රතිචාර දක්වන සහ රජයේ සහන ප්‍රමුඛතාවයන්ට අනුකූල වන බව සහතික කරන අතර ම, ද්විගුණවීම වළක්වා ගනිමින්, බලපෑමට ලක් වූ දිස්ත්‍රික්ක තුළ ඇති සියලු ම ප්‍රාදේශීය ලේකම් කාර්යාල ආවරණය වන බව සහතික කිරීම මෙම චක්‍රලේඛයෙහි අරමුණු වේ.

2025 දෙසැම්බර් මස මුල් භාගයේදී, ආරක්ෂක අමාත්‍යාංශය **කඩිනම් ආපදා සහන මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම සඳහා මාර්ගෝපදේශ**[74] නිකුත් කළේ ය. මෙම මාර්ගෝපදේශ මගින් විදේශ අරමුදල් යටතේ ක්‍රියාත්මක වන මැදිහත්වීම් ඇතුළු රාජ්‍ය නොවන සංවිධාන සහ ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන ක්‍රියාකාරකම් දිස්ත්‍රික් මට්ටමේ සහන සම්බන්ධීකරණ ව්‍යුහයන්ට අන්තර්ගත කර ගන්නා ලෙස දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම්වරුන්ට උපදෙස් දී ඇත. එමගින් රජය විසින් මෙහෙයවනු ලබන සහන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කරන කමිටු සඳහා මෙහෙයුම් කාර්ය භාරයන් විස්තර කරන අතර, සියලු ම විදේශීය ක්‍රියාකාරීන්ගේ ක්‍රියාකාරකම් නිල දිස්ත්‍රික් ජාල හරහා ක්‍රියාත්මක කරනු ලබන බව සහතික කරයි.

2025 දෙසැම්බර් 23 වෙනි දින විදේශ සම්පත් දෙපාර්තමේන්තුව '*දිට්වා සුළි කුණාටුව හේතුවෙන් සිදු වූ ස්වාභාවික විපත සැලකිල්ලට ගෙන දේශීය හා විදේශීය බාහිර ද්විපාර්ශ්වික සහ බහුපාර්ශ්වික හවුල්කරුවන් සම්බන්ධ කරගැනීම සඳහා වන අනිවාර්ය සම්බන්ධීකරණය*' යන මාතෘකාව යටතේ **අංක ERD/SC/Gen-II දරන චක්‍රලේඛය**[75] නිකුත් කළේ ය. රාජ්‍ය නොවන සංවිධාන සහ ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන ඇතුළුව සියලු ම රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ හවුල්කාර ආයතන විදේශීය ද්විපාර්ශ්වික සහ බහුපාර්ශ්වික හවුල්කරුවන් සමග පවත්වන සියලු අන්තර්ක්‍රියා රජය විසින් නම් කරන ලද මාර්ග හරහා සම්බන්ධීකරණය කළ යුතු බවට මෙම චක්‍රලේඛය මගින් නියම කර තිබේ. මැදිහත්වීම්වල ස්ථාවර බව සහතික කිරීම, වැඩසටහන් ද්විගුණවීම වැළැක්වීම, වගවීම පවත්වා ගැනීම සහ දිට්වා සුළි කුණාටුවට ප්‍රතිචාර වශයෙන් රැස්කරගත් විදේශ ආධාර පිළිබඳ අධීක්ෂණය සිදුකිරීම මෙම චක්‍රලේඛයෙහි අරමුණ වේ.

2025 දෙසැම්බර් මාසයේ දී ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය **විදේශ රටවලින් ලැබෙන සහන භාණ්ඩ එවීම සඳහා වන මාර්ගෝපදේශ** නිකුත් කළේය.[76] මෙම මාර්ගෝපදේශ මගින් රාජ්‍ය නොවන සංවිධාන, ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන සහ විදේශීය දූත මණ්ඩල විසින් ආනයනික සහන ද්‍රව්‍ය තොග සඳහා පූර්ව දැනුම්දීමක් ලබා දීම, ලියවිලි ඉදිරිපත් කිරීම සහ නිෂ්කාශනය ලබා ගැනීම

---

[73] https://civilsocietycollectiveforemergencyresponse.wordpress.com/wp-content/uploads/2025/12/cso-coordination_ministry-of-rural-development.pdf

[74] https://english.newsfirst.lk/2025/12/14/minisry-of-defence-issues-guidelines-for-accelerated-disaster-relief-operations

[75] https://www.erd.gov.lk/images/2025/Mandatory_Coordination_for_the_Engagement_with_External_Bilateral_and_Multilateral_Partners_both_Local_and_Foreign_in_View_of_the_Natural_Disaster_Caused_by_Ditwah_Cyclone.pdf; https://www.erd.gov.lk/index.php?Itemid=219&id=55&lang=en&option=com_content&view=article

[76] https://www.dmc.gov.lk/images/pdfs/Relief_%20Items_%20%20Communities_%20Cyclone%20Ditwah.pdf

සිදු කළ යුතු බවට නියම කර තිබේ. විදේශ රටවලින් ලැබෙන සියලු ම සහන ආධාර රජයේ නිල බෙදාහැරීමේ සැලසුම් වලට ක්‍රමානුකූලව ඒකාබද්ධ කරනු ලබන බව මෙම මාර්ගෝපදේශ මගින් සහතික කරනු ලැබේ.

### 7. විදේශ රටවල සහාය ලබාගැනීම සඳහා රජය සිදු කළ ආයාචනය

දිට්වා සුළි කුණාටුවේ විනාශකාරී බලපෑමෙන් පසුව ශ්‍රී ලංකා රජය ජාත්‍යන්තර ආපදා සහන සහ මානුෂීය සහාය ලබා දෙන ලෙස විධිමත් පරිදි ඉල්ලා සිටියේ ය. 2025 නොවැම්බර් 29 වෙනි දින ජනාධිපතිවරයා රට පුරා හදිසි තත්වයක් ප්‍රකාශයට පත් කර, ඒ සමගම ආපදා ප්‍රතිචාර සහ යථා තත්ත්වයට පත්කිරීමේ මෙහෙයුම් සඳහා සහාය වීම පිණිස කඩිනම් ආපදා සහන සහ මානුෂීය සහාය සපයා දෙන ලෙස ජාත්‍යන්තර ප්‍රජාවගෙන් ඉල්ලා සිටියේ ය.[77]

2025 දෙසැම්බර් 3 වෙනි දින රජය රාජ්‍ය තාන්ත්‍රික දූත මණ්ඩල, ද්විපාර්ශ්වික සහ බහුපාර්ශ්වික සංවර්ධන හවුල්කරුවන් සහ ජාත්‍යන්තර මූල්‍ය ආයතන එකට එක්කරමින්, භාණ්ඩාගාර ලේකම්වරයාගේ සහ මහ බැංකු අධිපතිවරයාගේ සම-සභාපතිත්වයෙන් යුත් ඉහළ මට්ටමේ පරිත්‍යාගශීලීන්ගේ සංසදයක් කැඳවූයේ ය. රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ, විදේශ කටයුතු අමාත්‍යාංශයේ, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සහ භාණ්ඩාගාර දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ඇතුළු ජ්‍යෙෂ්ඨ රජයේ නියෝජිතයන් හානි තක්සේරු වාර්තා ඉදිරිපත් කරමින්, විශේෂයෙන් ම කඩිනම් මානුෂීය ආධාර, සහනදායී මූල්‍ය පහසුකම්, ආහාර සැපයුම් සහ මධ්‍ය කාලීන ආධාර සඳහා විදේශ රටවල සහාය ලබා ගැනීමේ හදිසි අවශ්‍යතාවය පිළිබඳව සඳහන් කළහ. මෙම හදිසි අවස්ථාව අතරතුර දී ශ්‍රී ලංකාවට සහාය දැක්වීමට තමන් කැපවී සිටින බව හවුල්කාර පාර්ශ්වයන්හි නියෝජිතයන් නැවත තහවුරු කළහ.[78]

2025 දෙසැම්බර් 4 වෙනි දින, ශ්‍රී ලංකාව නිල වශයෙන් පිළිගෙන ඇති විදේශ රාජ්‍ය තාන්ත්‍රික ප්‍රජාව සහ ජාත්‍යන්තර සංවිධාන දැනුවත් කිරීම සඳහා අග්‍රාමාත්‍ය ආචාර්ය හරිනි අමරසූරියගේ සහ විදේශ කටයුතු අමාත්‍යවරයාගේ සම-ප්‍රධානත්වයෙන් පවත්වන ලද රාජ්‍ය තාන්ත්‍රික හමුවක දී, සුළි කුණාටුවෙන් සිදු වූ පුළුල් හානියෙන් පසු සිදු කෙරෙන ජාතික සහන කටයුතු, යථා තත්ත්වයට පත්කිරීමේ ප්‍රමුඛතා සහ ප්‍රතිසංස්කරණ සැලසුම් පිළිබඳ යාවත්කාලීන කිරීමක් ලබා දෙන ලදී. මෙම විස්තර කිරීමේ දී, මෙරටට ලබා දෙන ලද සහයෝගය වෙනුවෙන් රාජ්‍ය තාන්ත්‍රික දූත මණ්ඩලවලට ස්තූතිය පළ කළ අග්‍රාමාත්‍යවරිය, අත්‍යාවශ්‍ය සේවා ප්‍රතිස්ථාපනය කිරීම, ප්‍රවාහන යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය කිරීම, ජලය සහ සනීපාරක්ෂක පහසුකම් සපයාදීම සහ පුළුල් නැවත ගොඩනැගීමේ ප්‍රයත්නයන් ඇතුළු ප්‍රමුඛතා ක්ෂේත්‍රවලට දායකත්වය ලබා දෙන ලෙස ජාත්‍යන්තර හවුල්කරුවන්ගෙන් ඉල්ලා සිටියා ය.[79]

2025 දෙසැම්බර් 11 වන දින එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ මානුෂීය හවුල්කරුවන් මානුෂීය ප්‍රමුඛතා සැලැස්ම දියත් කරමින් දිට්වා සුළි කුණාටුවෙන් වඩාත් දැඩි ලෙස පීඩාවට පත් වූ ප්‍රජාවන්ට ජීවිතාරක්ෂක සහාය සැපයීම සඳහා එ.ජ.ඩො.මි. 35.3 ක ආධාර ඉල්ලා සිටියේය. මෙම සැලැස්ම දියත් කිරීම සිදු වූයේ ශ්‍රී ලංකා රජයේ ආයාචනයෙන් සහ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සමග පවත්වන ලද ඒකාබද්ධ කඩිනම් අවශ්‍යතා තක්සේරුවෙන් පසුව ය. එමගින් ජාත්‍යන්තර සහාය අවශ්‍ය කරන ක්ෂේත්‍ර වන ආහාර සුරක්ෂිතතාවය, සෞඛ්‍යය, ආරක්ෂාව, නවාතැන්, ජලය/සනීපාරක්ෂාව සහ කඩිනමින් යථා තත්ත්වයට පත්කිරීම ඇතුළු ක්ෂේත්‍ර පිළිබඳ දළ සැලැස්මක් ඉදිරිපත් කරයි. වඩාත් අවදානමට ලක්විය හැකි පුද්ගලයන් 658,000 ක් පමණ දෙනාට 2025 දෙසැම්බර් සිට 2026 අප්‍රේල් දක්වා කාලය තුළ ආධාර සපයා දීමට මෙම මානුෂීය ප්‍රමුඛතා

[77] https://srilanka.un.org/en/307212-cyclone-ditwah-situation-report-16-december-2025

[78] https://www.news.lk/current-affairs/international-development-partners-pledge-strong-support-for-sri-lankas-relief-and-recovery-after-cyclone-ditwah

[79] https://www.pmoffice.gov.lk/news.php?para=RU5vekFVR2dpQTd2VGRiMkZUNE4wS1Z4dHdxY0h2MkZGYlRoRGtYa1J4RnQ0aUF1SzVUSjFCbHNYMEJEaURYSw==

සැලැස්ම මගින් ඉලක්ක කරන අතර, ද්විපාර්ශ්වික සහ බහුපාර්ශ්වික පරිත්‍යාගශීලී ප්‍රජාව සමග එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සමායෝජිත ආයාචනය ඒකාබද්ධ කරයි.[80]

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ කඩිනම් ප්‍රතිචාර යාන්ත්‍රණයේ කොටසක් ලෙස, එක්සත් ජාතීන්ගේ මධ්‍යම හදිසි ප්‍රතිචාර අරමුදල විසින් බලපෑමට ලක් වූ ප්‍රජාවන් අතර හදිසි ආහාර ආධාර, නවාතැන් සහාය සහ ජල සැපයුම්, සනීපාරක්ෂක සහ සෞඛ්‍යාරක්ෂක සේවා ශක්තිමත් කිරීම පිණිස ඩී.ජ.ඩො.මි. 4.5 ක් වෙන් කළේ ය. ආයාචනය සිදු කර ඉතා කෙටි කලකින් මෙම වෙන්කිරීම් ලබා ගත හැකි වූ අතර, එය එක්සත් ජාතීන්ගේ බහුපාර්ශ්වික සම්බන්ධතාවය ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රතිචාරය සමග එක් කිරීමෙහි කොටසක් වේ.[81]

[80] https://srilanka.un.org/en/306891-united-nations-and-humanitarian-partners-call-us35-million-provide-life-saving-assistance
[81] https://srilanka.un.org/en/306739-united-nations-allocates-us45-million-its-global-emergency-fund-support-sri-lankans-affected